# අපේ සෙල්ලම් පාසල

## ගණිතය

## දෙවැනි ප්‍රධාන අවධිය

## 3 වැනි ශ්‍රේණිය

# ඉගෙනීමට උදවු

- මඟ පෙන්වීම
- ක්‍රියාකාරකම්
- පැවරුම්
- අභ්‍යාස

**මූලික පිටපත : සාකච්ඡාව හා සංශෝධනය සඳහා**

# පුතා දුව

මේ පොත සකස් කර ඇත්තේ ගණිතය ඉගෙන ගැනීමට ඔබට තව දුරටත් උදවු කිරීමේ බලාපොරොත්තුවෙනි. පාසලේ දී ගණිතය ඉගෙන ගැනීමට වෙන ම පොතක් තිබෙනවා නේද? ගුරුතුමාගෙන් හෝ ගුරුතුමියගෙන් හෝ ඔබ එම පොතෙන් ගණිතය ඉගෙන ගන්නවා ඇති. එහෙත් වළක්වන්න බැරි හේතුවක් නිසා පාසල් යාමට නොහැකි වන දවසක හෝ දවස් කිහිපයක හෝ උගන්වන දේ ඔබට ඉගෙන ගන්න ලැබෙන්නේ නැහැ නේද?. එසේ මඟ හැරෙන විෂය කොටස් ඉගෙන ගැනීමටත් ඔබට හරියට ඉගෙන ගැනීමට නොහැකි වූ නැවත කොටස් ඉගෙන ගැනීමටත් මේ පොත උදවු වනු ඇත.

පොතේ පාඩම් බොහොමයක් තනිව ම කියවා තේරුම් ගෙන අදාළ ක්‍රියාකාරකම්වල යෙදීමට හැකි වන අයුරින් මෙය සකස් කර ඇත. විෂය කරුණු හැකිතාක් සරල කර ඉදිරිපත් කර තිබෙනවා.

තනිව ම කියවා තේරුම් ගැනීමට අපහසු වන අවස්ථාවල දී පමණක් ගෙදර සිටින අයියා කෙනකුගෙන්, අක්කා කෙනකුගෙන්, අම්මාගෙන්, තාත්තාගෙන් හෝ වෙනත් වැඩිහිටි නෑදෑයකුගෙන් අදාළ පාඩම් තේරුම් කරවා ගන්න.

පෙළපොතක් වගේ ම වැඩ පොතක් හැටියටත් මේ පොත පරිහරණය කරන්න පුළුවන්. සමහර අභ්‍යාසවල උත්තර පොතේ ම සඳහන් කරන්න පුළුවන්.

එක වර්ගයකට අයත් පාඩම්වලට එක පාටක තීරුවක් යොදා ඇත. පාඩම් වර්ග වලට යෙදූ ඒ ඒ පාට තීරුව පිටුවල දාරය දිගේ දක්වේ. සමාන්තර ව යොදා ඇත. කිසියම් ක්‍රියාකාරකමක් කිරීමේ දී යම් අපහසුතාවක් ඇති වුවහොත් ඊට කලින් (එම පාට තීරුව සහිත) පිටුවක ඇති ක්‍රියාකාරකම කර සිටින්න. උනන්දුවෙන් මෙහි එන ක්‍රියාකාරකම්වල නිරත වන්න ගණිතය විෂය කරුණුවලට අදාළ අත්දැකීම් වැඩි කර ගන්න. එවිට ගණිතය ආශාවෙන් ඉගෙන ගනු ලබන ප්‍රියමනාප විෂයයක් බවට පත් කර ගැනීමට ඔබට හැකිවනු ඇත.

# 3 වැනි ශ්‍රේණිය
# ගණිතය
# අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

7.0 මිනුම් - දිග හා දුර
දිගක් සම්මත ඒකකයකින් නිවැරදි ව මැන ප්‍රකාශ කරයි.

10.0 මුදල්
වටිනාකම රුපියල් 20ට අඩු භාණ්ඩයක් හෝ භාණ්ඩ කිහිපයක් මිල දී ගෙන රුපියල් 20 ක් දුන් පසු ලැබිය යුතු ඉතුරු මුදල ගණනය කරයි.

1.0 සංඛ්‍යා
ඉලක්කම් 3 සංඛ්‍යාවක් හඳුනා ගෙන කියවයි.

2.0 සංඛ්‍යා - එකතු කිරීම
ගෙන යාම සහිත ව ඉලක්කම් 2 සංඛ්‍යා 2ක් එකතු කරයි.

3.0 සංඛ්‍යා - අඩු කිරීම
ගෙන ඒම සහිත ව ඉලක්කම් 2 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කරයි.

11.0 ඝන වස්තු හා හැඩතල
ඝන වස්තුවල මුහුණත් ඇසුරෙන් හැඩතල නම් කරයි.

8.0 පරිමාව හා ධාරිතාව
දෙන ලද ද්‍රව ප්‍රමාණයක් ලීටරවලින් හෝ මිලිලීටර ආසන්න 100ට හෝ මැන ප්‍රකාශ කරයි.

6.0 සංඛ්‍යා රටා
පොදු අන්තරය 2, 5 , 10 වූ සංඛ්‍යා රටාවක රටාව හඳුනා ගෙන ඊ ළඟ සංඛ්‍යාව ලියයි.

13.0 දිශාව
තමාට සාපේක්ෂ වමත්පස හා දකුණත් පස ඇති වස්තු නම් කරයි.

12.0 ප්‍රස්තාර
රූපික නිරූපණයකින් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාමය තොරතුරු කියවයි.

9.0 මිනුම් - කාලය
ඔරලෝසුවකින් පැය බාගයෙන් බාගයට වේලාව කියවයි.

4.0 ගුණ කිරීම
ගෙන යාම රහිත ව ඉලක්කම් 2 සංඛ්‍යාවක් 2න්, 5න් හා 10න් ගුණ කරයි.

5.0 බෙදීම
ගෙන ඒම රහිත ව 100 ට අඩු සංඛ්‍යාවක් 2න් හා 5න් බෙදයි.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංඛ්‍යා කියවීම | සංඛ්‍යා එකතු කිරීම | සංඛ්‍යා අඩු කිරීම | සංඛ්‍යා ගුණ කිරීම | සංඛ්‍යා බෙදීම | සංඛ්‍යා රටා | මිනුම් දිග හා ද්‍රව | මිනුම් ස්කන්ධය හා වර්ගඵලය | මිනුම් කාලය | මුදල් | සංඛ්‍යාන හා ගැටලු | ප්‍රස්තාර | දිශාව |
| 1.1 | 2.1 | | | | 6.1 | | | | 10.1 | | | |
| 1.2 | | 3.1 | | | | 7.1 | | 9.1 | | | | |
| | 2.2 | | | | 6.2 | | | | 10.2 | 11.1 | | |
| 1.3 | | 3.2 | | | | 7.2 | 8.1 | 9.2 | | | | |
| 1.4 | 2.3 | | 4.1 | | 6.3 | | | | | 11.2 | | |
| | | 3.3 | | 5.1 | | 7.3 | 8.2 | | 10.3 | | 12.1 | |
| 1.5 | 2.4 | | 4.2 | | | | | 9.3 | | | | |
| | | 3.4 | | 5.2 | 6.4 | | 8.3 | | 10.4 | 11.3 | | 13.1 |
| 1.6 | 2.5 | | 4.3 | | | 7.4 | | 9.4 | | | | |
| | | 3.5 | | 5.3 | | | | | 10.5 | | | |
| 1.7 | 2.6 | | 4.4 | 5.5 | | | | | | 11.4 | 12.2 | |
| | | 3.6 | | | | | 8.4 | | 10.6 | | | |
| 1.8 | 2.7 | | | 5.4 | | 7.5 | | 9.5 | | | | 13.2 |
| | | 3.7 | 4.5 | | | | | | 10.7 | | 12.3 | |
| | 2.8 | | | 5.5 | | | | 9.6 | | 11.5 | | |
| 1.9 | | 3.8 | 4.6 | | | | | | 10.8 | | 12.4 | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| 9 | 8 | 8 | 6 | 5 | 5 | 4 | 6 | 8 | 5 | | 4 | 2 |

රතු

## එක් එක් ක්‍රියාකාරකම මගින් දරුවන් ලබන නිපුණතාව

### 7.0 මිනුම් - දිග හා දුර

7.1 ගිනිකූරකින් දිග මනියි.

7.2 කෝටුවකින් දුර මනියි.

7.3 මීටර කෝදුව හඳුනා ගනියි.

7.4 මීටරවලින් දිග මනියි.

7.5 නිමානය කළ දිග සමග සැබෑ දිග සසඳයි.

### 10.0 මුදල්

10.1 අපේ කාසි හඳුනා ගනියි.

10.2 රුපියල් කාසි සහ සත කාසිවල එකතුව සොයයි.

10.3 රුපියල් 10කින් ආපසු ලැබෙන ඉතුරු මුදල සොයයි.

10.4 රුපියල් 10 හා රුපියල් 20 නෝට්ටු හඳුනා ගනියි.

10.5 රුපියල් 20ට අඩු මුදලක්, නෝට්ටු හා රුපියල් කාසිවලින් දක්වයි.

10.6 රුපියල් 20කින් ආපසු ලැබෙන ඉතුරු මුදල සොයයි.

10.7 රුපියල් 50 සහ රුපියල් 100 නෝට්ටු හඳුනා ගනියි.

10.8 රුපියල් සතවලින් ගනුදෙනු කරයි.

### 1.0 සංඛ්‍යා සංකල්ප - සංඛ්‍යා කියවීම

1.1 ඉලක්කම් හඳුනා ගෙන කියවයි.

1.2 ඉලක්කම් 2 සංඛ්‍යාවක් අකුරෙන් හා ඉලක්කමෙන් ලියයි.

1.3 ඉලක්කම් 2 සංඛ්‍යාවක ඉලක්කම් පිහිටි ස්ථානය හා ස්ථානීය අගය නිවැරදි ව දක්වයි..

1.4 ඉලක්කම් 2 සංඛ්‍යාවක් ද්‍රව්‍ය ආශ්‍රිත ව පෙන්වයි.

1.5 සංඛ්‍යා නාමය හා සංඛ්‍යාංකය හඳුනා ගනියි

1.6 ඉලක්කම් 3 සංඛ්‍යාවක් ද්‍රව්‍ය ආශ්‍රිත ව පෙන්වයි.

1.7 ගණක රාමුවක නිරූපිත ඉලක්කම් 3 සංඛ්‍යාවක් කියවයි.

1.8 ඉලක්කම් 3 සංඛ්‍යාවක එක් එක් ඉලක්කමේ ස්ථානීය අගය සහ ස්ථානය අනුව එහි අගය දක්වයි.

1.9 සංඛ්‍යාංකයක් ඊට අනුරූප සංඛ්‍යාංක කිහිපයකින් නිවැරදි ව තෝරා ගෙන කියවයි.

## 2.0 සංඛ්‍යා - එකතු කිරීම

2.1 එකතුව 10 වන සංඛ්‍යා 2ක් එකතු කරයි.

2.2 එකතුව 10ට නොවැඩි සංඛ්‍යා 2ක් එකතු කරයි.

2.3 එකතුව 9ට වැඩි 18ට අඩු සංඛ්‍යා 2ක් එකතු කරයි.

2.4 ඉලක්කම් 2 සංඛ්‍යාවකට 10ක් එකතු කරයි.

2.5 100ට අඩු 10 ගුණාකාර සංඛ්‍යාවකට තනි ඉලක්කමේ සංඛ්‍යාවක් එකතු කරයි.

2.6 ඉලක්කම් 2 සංඛ්‍යාවකට තනි ඉලක්කමේ සංඛ්‍යාවක් එකතු කරයි.

2.7 ගෙන යාම රහිත ඉලක්කම් 2 සංඛ්‍යා 2ක් එකතු කරයි.

2.8 ගෙන යාම සහිත ඉලක්කම් 2ක් එකතු කරයි.

## 3.0 සංඛ්‍යා - අඩු කිරීම

3.1 10 කින් 10 ට අඩු සංඛ්‍යාවක් අඩු කරයි.

3.2 අඩු කිරීමේ මූලික සංඛ්‍යා බන්ධන ප්‍රගුණ කරයි.

3.3 18 ට නොවැඩි සංඛ්‍යාවකින් තනි ඉලක්කමේ සංඛ්‍යාවක් අඩු කරයි.

3.4 ගෙන ඒම රහිත අවස්ථාවක ඉලක්කම් 2 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කරයි.

3.5 ගෙන ඒම රහිත අවස්ථාවක ඉලක්කම් 2 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කිරීම ගණක රාමුවකින් නිරූපණය කරයි.

3.6 ගෙන ඒම රහිත අවස්ථාවක ඉලක්කම් 2 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කිරීමට අදාළ ගැටලු විසඳයි.

3.7 ගෙන ඒම සහිත අවස්ථාවක ඉලක්කම් 2 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කරයි.

3.8 ඉලක්කම් 2ට නොවැඩි සංඛ්‍යා එකතු කිරීම , අඩු කිරීම හා සම්බන්ධ ගැටලු විසඳයි.

## 11.0 ඝන වස්තු හා හැඩතල

6.1 විවිධ පරිසර වස්තු ඇසුරෙන් ඝනකය, ඝනකාභය සහ සිලින්ඩරය හැඩයේ ඝන වස්තු හඳුනා ගනියි.

6.2 ඝනකය, ඝනකාභය සහ චතුස්තලය යන ඝන වස්තුවල පැති දාර සහ මුලුවල ඇති ලක්ෂණ හඳුනා ගනියි.

6.3 සිලින්ඩරයක ඝනකාභයක පැති, දාර හා මුළු සසඳයි.

6.4 ඝන වස්තුවල මුහුණත් ඇසුරෙන් ඍජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණය සහ වෘත්තය යන ජ්‍යාමිතික හැඩ හඳුනා ගනියි.

6.5 ජ්‍යාමිතික හැඩවල මූලික ලක්ෂණ හඳුනා ගනියි.

## 8.0 මිනුම් - පරිමාව හා ධාරිතාව

8.1 හැඩය වෙනස්, තරම බොහෝ දුරට සමාන බඳුන් 2ට අල්ලන ජල ප්‍රමාණ කෝප්පයකින් මැන සසඳයි.

8.2 ජල ප්‍රමාණයක් ආසන්න ලීටරයට මනියි.

8.4 මිනුම් සරාවක ආධාරයෙන් ජල පරිමාවක් ආසන්න ලීටරයට හෝ ආසන්න මිලිලීටර 100ට මනියි.

**6.0** **සංඛ්‍යා - සංඛ්‍යා රටා**

6.1 රූප රටා ඇසුරෙන් සංඛ්‍යා රටා ගොඩ නගයි.

6.2 පොදු අන්තරය 2 වූ සංඛ්‍යා රටා හඳුනා ගනියි. ගොඩ නඟයි.

6.3 රටාවකට අනුව රූප අඳියි.

6.4 පොදු අන්තරය 10 වන සංඛ්‍යා රටා ගොඩ නඟයි. හඳුනා ගනියි.

6.5 පොදු අන්තරය 5 වන සංඛ්‍යා රටා හඳුනා ගනියි. ගොඩ නඟයි.

**13.0** **දිශාව**

13.1 ඉදිරි පස පිටු පස වමත් පස සහ දකුණත් පස යන දිශා හඳුනා ගනියි.

13.2 විධාන මාලාවක් පැහැදිලි ව දීමට හා විධානයකට නිවැරදි ව ප්‍රතිචාර දැක්වීමට හුරුව ලබයි.

**12.0** **ප්‍රස්තාර**

12.1 සංඛ්‍යාමය තොරතුරු රූපික ව නිරූපණය කරයි.

12.2 සංඛ්‍යාමය තොරතුරු සංකේතවලින් නිරූපණය කෙරෙන චිත්‍ර ප්‍රස්තාර ගොඩ නඟයි.

12.3 ප්‍රගණන වගුවක් භාවිතයෙන් සංඛ්‍යාමය තොරතුරු රැස් කරයි.

12.4 වගුවක දැක්වෙන සංඛ්‍යාමය තොරතුරු රූපික ව ප්‍රස්තාරයකින් නිරූපණය කරයි.

**9.0** **මිනුම් - කාලය**

9.1 ඔරලෝසු මුහුණතක අංක පිහිටීම, පැය කටුවට සාපේක්ෂ ව මිනිත්තු කටුව ගමන් කරන ආකාරය හඳුනා ගනියි.

9.2 පූර්ණ පැයවලින් ඔරලෝසු මුහුණතක වේලාව දැක්වෙන විට එය කියවයි.

9.3 උදය, දහවල, සවස සහ රැය හා සම්බන්ධ විවිධ වේලාවල් සමග දවසේ සිද්ධි ගළපයි.

9.4 ඔරලෝසු මුහුණතක මිනිත්තු කටුව 6 ට යොමුව ඇති අවස්ථාවක දැක්වෙන වේලාව කියවයි.

9.5 සතියේ දවස්වල නම් සහ දවස්වල අනුපිළිවෙළ දැන ගනියි.

9.6 මාසවල නම් අනුපිළිවෙළට මතකයෙන් කියයි.

## 4.0 සංඛ්‍යා - ගුණ කිරීම

4.1 2 හි ගුණන වගුව නැවත මතක් කර ගනියි.

4.2 2 හි ගුණන වගුව ඇසුරෙන් සරල ගණිත ගැටලු විසඳයි.

4.3 5 හි ගුණන වගුව නැවත මතක් කර ගනියි.

4.4 5 හි ගුණන වගුව ඇසුරෙන් සරල ගණිත ගැටලු විසඳයි.

4.5 10 හි ගුණන වගුව නැවත මතක් කර ගනියි.

4.6 ඉලක්කම් 2 සංඛ්‍යා 2න් හෝ 5න් හෝ ගුණ කිරීමට අදාළ ගණිත ගැටලු විසඳයි.

## 5.0 සංඛ්‍යා - බෙදීම

5.1 ද්‍රව්‍ය 20ක් දෙදෙනකු අතර සම සම ව බෙදයි.

5.2 ඉතුරුවක් නොලැබෙන ඉලක්කම් 2 සංඛ්‍යා 2න් බෙදයි.

5.3 ගෙන ඒම රහිත 100ට අඩු සංඛ්‍යාවක් 5 දෙනකු අතර සම සම ව බෙදයි.

5.4 30 ට අඩු ද්‍රව්‍ය සංඛ්‍යාවක් 5 දෙනකු අතර සම සම ව බෙදයි.

5.5 ඉලක්කම් 2 සංඛ්‍යාවක් 5 න් බෙදීමට අදාළ ගැටලු විසඳයි.

# සංඛ්‍යා

## 1.1 සංඛ්‍යා කියවමු

(i) එක් එක් සංඛ්‍යාවට ගැළපෙන නම ඉරකින් යා කරන්න.




(ii) පහත දැක්වෙන මුළු ඉලක්කම් ගණන ලියන්න.

| | | | |
|---|---|---|---|
| 7 | 4 | 1 | 9 |
| 2 | 0 | 3 | |
| 5 | 8 | 6 | 2 |
| 0 | 1 | 3 | |

0 සිට 9 තෙක් වූ ඉලක්කම් පිළිවෙළින් කපා හරින්න.

ඉතුරු වන ඉලක්කම් පහත කොටු තුළ අනුපිළිවෙළට ලියන්න.

| | | | |
|---|---|---|---|
| ................ | ................ | ................ | ................ |

# සංඛ්‍යා එකතු කිරීම

## 2.1 එකතුව 10 වන සංඛ්‍යා 2ක් එකතු කරමු.



මෙම බෝල ගණක රාමුව දෙස බලන්න. සෑම පේළියක ම බෝල 10 බැගින් ඇත. පේළිවල බෝල වෙන් කර ඇති ආකාරය බලන්න.

1 වන පේළිය (1 , 9)
2 වන පේළිය (2 , 8)
3 වන පේළිය (3 , 7)
4 වන පේළිය (4 , 6)
------------------
------------------
------------------
------------------
9 වන පේළිය (9 , 1)
10 වන පේළිය (10 , 0) ------ ආදි වශයෙනි.

ඉහත ඕනෑ ම සංඛ්‍යා යුගළයක එකතුව කීය දැයි කිව හැකි ද?

**අභ්‍යාසය**
පහත එක් එක් හිස් කොටුව තුළ ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

8 + ☐ = 10    1 + ☐ = 10    4 + ☐ = 10

6 + ☐ = 10    9 + ☐ = 10    2 + ☐ = 10

5 + ☐ = 10    3 + ☐ = 10    7 + ☐ = 10

10 + ☐ = 10

පහත සඳහන් සංඛ්‍යා යුගළ අතරින් එකතුව 10 වන සංඛ්‍යා යුගළ තෝරන්න.

( 3 + 7), (4 + 5), (6 + 3), ( 5 + 5), (4 + 6)

(1 + 9), (2 + 7), (3 + 5), (6 + 4), (2 + 8)

(3 + 6), (4 + 6), (10 + 0), (8 + 2), (9 + 1)

# සංඛ්‍යා රටා

## 8.1 රූප රටා ඇසුරෙන් සංඛ්‍යා රටා ගොඩ නගමු

දිග 30cm 6 cm පළල කඩදාසි තීරුවක් පහත රූපයේ පෙන්වන පරිදි සමාන කොටස් 6 ට නවා ගන්න.
වමත් පස කොටසේ සිට පිළිවෙළින් "බොත්තම්" රූප 1ක්, 2ක්, 5ක් ආදි වශයෙන් 6 තෙක් අඳින්න.
කොටසක් හැර කොටසක ළා පාටක් යොදා ගන්න.



කොටස් එක මත එක හකුළුවන්න.
1 2 3 වෙනි කොටස් පමණක් පෙන්වා ඊ ළඟට තිබිය යුතු රූප කීයක් දැයි අසන්න.
පිළිතුර ලැබුණු පසු ඊළඟ කොටස දිග හැර පෙන්වන්න.
මෙලෙස කොටස් 6 ම ඉදිරිපත් කරන්න.

(1) පාට කොටස්වල ඇති රූප රටාව පිළිබඳ විමසන්න.
බොත්තම් රූප 2 ,4, 6 වේ.
ඊ ළඟට ආ යුතු බොත්තම් රූප ගණන අසන්න.
මේ අයුරින් 2 4 6 8 ------ සංඛ්‍යා රටාව ගොඩ නගන්න.

(2) පාට නොකළ කොටස්වල රූප රටාව පිළිබඳ විමසන්න.
බොත්තම් රූප ☐ ☐ ☐ වේ.
ඊ ළඟට ආයුතු රූපය ☐ විය යුතු ය.

**අභ්‍යාසය 1**

එක් එක් රූප රටාවේ සංඛ්‍යා රටාව පහත හිස් කොටු තුළ ලියන්න.

(1)



☐ , ☐ , ☐ , ☐ , ☐ , ☐

(2)



(3)



(4)



(5)



**අභ්‍යාසය 2**

එක් එක් සංඛ්‍යා රටාවේ ඊ ළඟට ආ යුතු සංඛ්‍යා 2 හිස් කොටු තුළ ලියන්න.

(1) 9 , 8 , 7 , 6 , ☐ , ☐

(2) 15 , 16 , 17 , 18, ☐ , ☐

(3) 1 , 4 , 9 , 1 , ☐ , ☐

(4) 0 , 5 , 0 , 5, ☐ , ☐

(5) 2 , 4 , 6 , 8, ☐ , ☐

# මුදල්

## 10.1 අපේ කාසි හඳුනා ගනිමු.

සත කාසි

රුපියල් කාසි

(1) සත කාසි වර්ග කීයක් තිබේ ද?

(2) සත කාසි වර්ග ඔබ දැක නැති කාසි මොනවා ද?

(3) අද භාවිත කරන සත කාසි වර්ග 2 හි අගය ලියන්න.

(4) රුපියල් කාසි වර්ග කීයක් තිබේ ද?

(5) රුපියල් කාසියක් වෙනුවට භාවිත කරන මුදල් නෝට්ටුවක් ඇත. එහි අගය රුපියල් කීය ද?

පැවරුම
දැනට භාවිත නොවන සත කාසි වර්ග සොයා ගන්න.
ඊට වැඩිහිටි අයගෙන් උදවු ලබා ගන්න.

# සංඛ්‍යා

## 1.2 සංඛ්‍යා අකුරෙන් හා ඉලක්කමෙන් ලියමු.

(1) මුළු කොටු ගණන හිස් කොටුව තුළ **අකුරෙන්** ලියන්න. නිදසුන බලන්න.

| දහයේ කොටු | කොටු | මුළු කොටු ගණන |
|---|---|---|
|  |  | හැටඅට |
|  |  | ...................... |
|  |  | ...................... |
|  |  | ...................... |

(2) මුළු පුවක් ගෙඩි ගණන හිස් කොටුව තුළ ඉලක්කමෙන් ලියන්න. නිදසුන බලන්න.

| දහයේ පුවක් මලු | පුවක් ගෙඩි | මුළු ගෙඩි ගණන |
|---|---|---|
|  |  | 47 |
|  |  | ...................... |
|  |  | ...................... |
|  | | ...................... |

# සංඛ්‍යා අඩු කිරීම

## 3.1 10කින් 10 තෙක් වූ සංඛ්‍යාවක් අඩු කරමු.




මෙම "බෝල ගණක රාමුවේ" සෑම පේළියක ම බෝල 10 බැගින් ඇත. එක් එක් පේළියේ බෝල වෙන් කර ඇති සැටි බලන්න. ඕනෑම පේළියක බෝලවල එකතුව කීයක් වේ ද?

**අභ්‍යාසය 1**

ගණක රාමුව බලා හිස් තැන් පුරවන්න.

| | | |
|---|---|---|
| 10 - ☐ = 5 | 10 - ☐ = 9 | 10 - ☐ = 7 |
| 10 - ☐ = 3 | 10 - ☐ = 4 | 10 - ☐ = 8 |
| 10 - ☐ = 2 | 10 - ☐ = 6 | 10 - ☐ = 1 |
| 10 - ☐ = 0 | | |

**අභ්‍යාසය 2**

ගණක රාමුව බලා හිස් තැන් පුරවන්න.

| | | |
|---|---|---|
| 10 - 1 = ☐ | 10 - 5 = ☐ | 10 - 8 = ☐ |
| 10 - 3 = ☐ | 10 - 6 = ☐ | 10 - 2 = ☐ |
| 10 - 4 = ☐ | 10 - 7 = ☐ | 10 - 9 = ☐ |
| 10 - 0 = ☐ | | |

**අභ්‍යාසය 3**

10 ක් වීමට එක් එක් සංඛ්‍යාවට එකතු කළ යුතු සංඛ්‍යාව ලියන්න. නිදසුන : හයට [හතරක්]

| | | |
|---|---|---|
| (1) අටට ☐ | (4) බිංදුවට ☐ | (7) නමයට ☐ |
| (2) තුනට ☐ | (5) හතට ☐ | (8) දෙකට ☐ |
| (3) පහට ☐ | (6) එකට ☐ | (9) හතරට ☐ |
| | | (10) දහයට ☐ |

# මිනුම් - දිග හා දුර

## 7.1 දිග මනිමු.

මේ එක් එක් රූපයේ දිග ගිනිකූරකින් මනින්න. ආසන්න ගිනිකූරු ගණන ඉලක්කමෙන් පහත වගුවේ දක්වන්න.

වගුව

| **රූපය** | **ගිනිකූරු ගණන** |
|---|---|
| පනාව | |
| පැන්සල | |
| මේස පිහිය | |
| තේ හැන්ද | |
| දත් බුරුසුව | |

# මිනුම් - කාලය

## 9.1 ඔරලෝසු මුහුණත හඳුනා ගනිමු.

ඔරලෝසු මුහුණතක් ප්‍රදර්ශනය කර

* පැය කටුව හා මිනිත්තු කටුව දකුණතට ගමන් කිරීම.
* මිනිත්තු කටුව වටයක් යන විට පැය කටුව කෙටි දුරක් යෑම වැනි ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.

අභ්‍යාසය 1




රූපයෙහි දක්වෙන ඔරලෝසු මුහුණතෙහි වේලාව හඳුනා ගන්න.

(1) ඔරලෝසුවෙහි දක්වෙන වේලාව කීය ද?

(2) මිනිත්තු කටුව ඉදිරියට තව වටයක් ගිය විට පැය කටුව පෙන්වන අංකය කුමක් ද?

(3) එම වේලාව කීය ද?

(4) පැය කටුව 9 පෙන්වන විට මිනිත්තු කටුව වට කීයක් ගොස් තිබේ ද?




**ක්‍රියාකාරම** රවුම් පියනක ආධාරයෙන් වෘත්තයක් ඇඳ ඒ මත පළමුවෙන් 12, 3, 6 සහ 9 ලකුණු කර, පසු ව 1 සිට 12 තෙක් වූ අංක සඳහන් කර ඔරලෝසු මුහුණතක් ඇඳීමට සලස්වන්න. (රූපය බලන්න)




මෙලෙස ඔරලෝසු මුහුණත් 3ක් ඇඳ පහත සඳහන් වේලාවන් දක්වන්න.

(1) වේලාව 3 (2) වේලාව 9 (3) වේලාව 6

,
,

# සංඛ්‍යා - එකතු කිරීම

## 1.11 සංඛ්‍යා 2 ක් එකතු කරමු

අභ්‍යාසය

එකතු කිරීමේ වගුවක් ඉහත දැක්වේ.
පේළියක මුල් සංඛ්‍යාව එක් එක් තීරයේ මුල් සංඛ්‍යාවට එකතු කර උත්තරය පේළි - තීර එකිනෙක හමු වන කොටුවේ ලියන්න.

නිදසුන් බලන්න

පේළිය 3 + තීරය 2 = 5
පේළිය 7 + තීරය 3 = 10

# සංඛ්‍යා - සංඛ්‍යා රටා

## 6.2 සංඛ්‍යා රටා හඳුනා ගනිමු

1 සිට 10 තෙක් සංඛ්‍යාංක ලියා ඇති ආකාරය බලන්න.

1 වන පේළිය 1 3 5 7 9

2 වන පේළිය 2 4 6 8 10

කලින් හඳුනා ගත් සංඛ්‍යා රටා දෙක මෙම පේළි දෙකෙහි දැක්වෙයි.

1, 3 , 5, 7, 9, -------

2 , 4 , 6 , 8, 10, -----

සංඛ්‍යා රටා 2 හි ම එක් එක් සංඛ්‍යාවට 2ක් එකතු වී ඊ ළඟ සංඛ්‍යාව සෑදී ඇත.
එක ළඟ පිහිටි ඕනෑ ම සංඛ්‍යා 2ක් අතර වෙනස 2 නිසා රටාවේ **පොදු අන්තරය** 2 ලෙස හඳුන්වමු.
1, 3 , 5, 7, 9, ------- යනු ඔත්තේ සංඛ්‍යා රටාව යි
2 , 4 , 6 , 8, 10, ----- යනු ඉරට්ටේ සංඛ්‍යා රටාවයි

නිදසුන : 30 28 26 24 ---- සංඛ්‍යා රටාවේ ඊ ළඟට ආ යුතු සංඛ්‍යා දෙක සොයන්න.

30 - 28 = 2
28 - 26 = 2
26 - 24 = 2 නිසා **පොදු** වෙනස හෙවත් **පොදු අන්තරය** 2 වේ.

ඊ ළඟට ආ යුතු සංඛ්‍යාව

24 - 2 = 22 හා 22 - 2 = 20 වේ.
එනම් 30 , 28, 26, 24, [22], [20] වේ.

**අභ්‍යාස 1**
පොදු අන්තරය 2 වන සංඛ්‍යා රටා තෝරා ලියන්න.
(1) 2, 4, 8, 14
(2) 1, 5, 3, 7
(3) 41, 39, 37, 35
(4) 5, 9, 13, 17
(5) 19, 21, 23, 25

**අභ්‍යාස 2**
එක් එක් සංඛ්‍යා රටාවේ ඊ ළඟට ආ යුතු සංඛ්‍යාව ලියන්න.
(1) 0, 2, 4, 6
(2) 25, 27, 29, 31
(3) 50, 52, 54, 56
(4) 13, 11, 9, 7
(5) 201, 203, 205, 207

# මුදල්

## 10.2 කාසිවල එකතුව සොයමු

එක් එක් පේළියේ කාසිවල එකතුව හිස් කොටුව තුළ ලියන්න.

රුපියල් 1 රුපියල් 2 රුපියල් 5 = ☐

රුපියල් 2 රුපියල් 2 රුපියල් 2 රුපියල් 2 = ☐

රුපියල් 5 රුපියල් 5 රුපියල් 5 = ☐

රුපියල් 5 රුපියල් 5 රුපියල් 10 = ☐

සත 50 සත 50 = ☐

සත 50 සත 25 සත 25 = ☐

සත 25 සත 25 සත 25 සත 25 = ☐

රුපියල් 2 රුපියල් 5 සත 50 සත 25 = ☐

# ඝන වස්තු හා හැඩතල

## 11.1 ඝන වස්තු හඳුනා ගනිමු.

ලී මඩුවකින් හෝ වඩු මඩුවකින් කපා ඉවත දමන කුඩා ලී කැබලි, පරණ බැටරි කැලි, වැලි පිර වූ පියන සහිත කුඩා ටින්, විවිධ හැඩයේ සහ විවිධ තරමේ ඇසුරුම් පෙට්ටි යන මේවා දරුවන්ගේ ද දෙමාපියන්ගේ ද සහාය ඇති ව සොයා ගන්න.

පෙට්ටි, ටින් , ඇසුරුම් මේ ද්‍රව්‍ය සියල්ල ඉදිරිපත් කර ඒවායේ බාහිර හැඩය අනුව ගොඩවල් 3 ට වෙන් කරවන්න.



දන්තාලේප ඇසුරුම් පෙට්ටි හැඩයේ ඒවා | දාදු කැට හැඩයේ ඒවා | කිරි ටින් හැඩයේ ඒවා

ඒ ඒ ගොඩ හැඳින්වීමට පොදු නමක් බැගින් යෝජනා කිරීමට කියන්න.

ඔවුන් අපොහොසත් වනුයේ නම්

1. ඝනකාභය
2. ඝනකය
3. සිලින්ඩරය යන නම් ඉදිරිපත් කරන්න.

ඝනවස්තුවල පැතිවල හැඩය හා ස්වභාව, දාරවල ඍජු හා වක්‍ර බව හා මුලුවල පිහිටීම යන ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ඉහත වර්ග 3ට අයත් පරිසරයේ දක්නට ලැබෙන ඝන වස්තු උදාහරණ ලෙස ඉදිරිපත් කිරීමට යොමු කරන්න.

# සංඛ්‍යා

## 1.3 සංඛ්‍යාවක ස්ථානීය අගය හඳුනා ගනිමු.

(1) නිදසුන බලා පහත වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | දහයස්ථානය | | එකස්ථානය | |
|---|---|---|---|---|
| | ඉලක්කම | ඉලක්කමේ අගය | ඉලක්කම | ඉලක්කමේ අගය |
| 78 | 7 | 70 | 8 | 8 |
| 21 | | | | |
| 44 | | | | |
| 90 | | | | |
| 39 | | | | |
| 12 | | | | |
| 63 | | | | |
| 36 | | | | |

(2) පහත වගුවේ ගැළපෙන නිදසුන බලන්න. ඒ ඒ හිස් කොටුව තුළ සංඛ්‍යාව ලියන්න.

| දහයස්ථානය | | එකස්ථානය | | සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඉලක්කම | ඉලක්කමේ අගය | ඉලක්කම | ඉලක්කමේ අගය | |
| 5 | 50 | 6 | 6 | 56 |
| -- | 30 | -- | 7 | --- |
| 9 | --- | 8 | ---- | --- |
| --- | --- | ----- | ---- | 43 |
| --- | 20 | 1 | --- | --- |
| 7 | ---- | 7 | --- | --- |
| --- | ---- | ---- | 8 | 88 |
| --- | 10 | ---- | 4 | --- |

# සංඛ්‍යා අඩු කිරීම

## 3.2 අඩු කිරීම ප්‍රගුණ කරමු.

අඩු කාලයකින් මෙම අභ්‍යාසයට පිළිතුරු සපයන්න.

අඩු කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) |
| 9 | 6 | 5 | 4 | 7 | 8 |
| - 1 | - 5 | - 5 | - 2 | - 7 | - 1 |
| | | | | | |
| (7) | (8) | (9) | (10) | (11) | (12) |
| 6 | 9 | 7 | 5 | 8 | 3 |
| - 4 | - 2 | - 6 | - 4 | - 2 | - 2 |
| | | | | | |
| (13) | (14) | (15) | (16) | (17) | (18) |
| 3 | 7 | 9 | 8 | 4 | 6 |
| - 3 | - 5 | - 3 | - 3 | - 4 | - 3 |
| | | | | | |
| (19) | (20) | (21) | (22) | (23) | (24) |
| 7 | 5 | 8 | 9 | 6 | 4 |
| - 4 | - 1 | - 8 | - 4 | - 2 | - 1 |
| | | | | | |
| (25) | (26) | (27) | (28) | (29) | (30) |
| 9 | 8 | 6 | 5 | 9 | 7 |
| - 6 | - 5 | - 1 | - 2 | - 5 | - 3 |
| | | | | | |
| (31) | (32) | (33) | (34) | (35) | (36) |
| 8 | 9 | 6 | 7 | 8 | 9 |
| - 6 | - 7 | - 6 | - 2 | - 7 | - 8 |
| | | | | | |
| (37) | (38) | (39) | (40) | (41) | (42) |
| 4 | 8 | 7 | 9 | 6 | 3 |
| - 3 | - 4 | - 1 | - 9 | - 3 | - 1 |
| | | | | | |

# මිනුම් - දිග හා දුර

## 7.2 කෝටුවකින් දුර මනිමු

වීසි කළ හැකි ඇට මල්ලක් හෝ සවිමත් ගඩොළක් හෝ වැනි දෙයක් සොයා ගන්න.

මිදුලේ ලකුණු කළ තැනක සිට දෑතින් ඇට මල්ල හැකිතාක් දුර විසි කරන්න. ඔබේ අත තරම් දිග කෝටුවකින් වැටුණු දුර මැන සටහන් කර ගන්න.

සැම කෙනෙක් ම මෙසේ වීසි කරන දුර ලකුණු කර කෝටුවෙන් මැන සටහන් කර ගන්න.

දැමු වැඩි ම දුර හා අඩු ම දුර කෝටු ගණන කොපමණ ද?

# මිනුම් - පරිමාව හා ධාරිතාව

## 8.1 ජල ප්‍රමාණ මැන සසඳමු.

හිස් පැණි බීම බෝතලයක්, ජෑම් බෝතලයක්, ප්ලාස්ටික් ජෝග්ගුවක්, බාගේ බෝතලයක් වැනි තරම බොහෝ දුරට සමාන බඳුන් 2ක් ජලය සහිත බඳුනක් , කුඩා ප්ලාස්ටික් කෝප්පයක් සපයා දෙන්න.

| | | | | |
|---|---|---|---|---|
| පැණි බීම බෝතලය | බෝතල බාගය | ජෑම් බෝතලය | ප්ලාස්ටික් ජෝග්ගුව | කුඩා ප්ලාස්ටික් කෝප්පය |
| 1 | 2 | 3 | 4 | 5 |

කැමති බඳුන් 2ක් තෝරා ගෙන පළමුවෙන් ඒවා ජලයෙන් පුරවන්න. එම ජලය කුඩා ප්ලාස්ටික් කෝප්පයට සීරුවෙන් වත් කර කොපමණ කෝප්ප ගණනක් බඳුන් 2 හි ඇති දැයි මැන බලන ලෙස කියන්න.

ජලය වැඩියෙන් අල්ලන බඳුන කුමක් දැයි තීරණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පැවරුම : පීරිසි කුට්ටමක පීරිසියට හා පීරිසි කෝප්පයට අල්ලන ජල පරිමා දෙක සසඳන්න. ජල පරිමා සමාන ද? අසමාන ද?

රතු

# වේලාව කියවමු

## 9.2 පූර්ණ පැයවලින් ඔරලෝසු මුහුණත

කටු 2ම 12 ට යොමු කර ඇති සැබෑ ඔරලෝසු මුහුණතක් දරුවනට පෙන්වන්න.

වේලාව 12 බව කියන්න. මිනිත්තු කටුව සම්පූර්ණ වටයක් කරකවන්න. කටුවල ගමන නිරීක්ෂණය කිරීමට අවස්ථාව සලසන්න. නැවත කටු කරකවමින් පැයෙන් පැයට වේලාව මෙපමණ කැයි කියා හඳුන්වා දෙන්න.

සම්පූර්ණ පැය ගණනකින් වේලාව දැක්වෙන අවස්ථාවල දී පැය කටුවේ සහ මිනිත්තු කටුවේ පිහිටීම් පිළිබඳ අවධානය යොමු කරවන්න.



වේලාව 12 යි    වේලාව 3යි    වේලාව 6යි    වේලාව 9යි

**අභ්‍යාසය 1**

(1) පහත එක් එක් ඔරලෝසු මුහුණතෙහි දක්වන වේලාව ඊට යටින් ලියන්න.



වේලාව ----   වේලාව ----   වේලාව ----   වේලාව ----   වේලාව ----

(2) මේ එක් එක් වේලාවෙන් පැය 1 ට පසු වේලාව දක්වන්න.



වේලාව ----   වේලාව ----   වේලාව ----   වේලාව ----   වේලාව ----

# සංඛ්‍යා

## 1.4 100ට අඩු සංඛ්‍යාවක් ද්‍රව්‍යවලින් පෙන්වමු

පැවරුම :

එක හා සමාන 10cm පමණ දිග ඉරටු කැබලි 100 ක් දෙන්න. ඒවායින් 10 ඉරටු මිටි 9ක් රබර් වළලුවලින් හෝ නූල්වලින් බැඳීමට කියන්න-.

මදටිය වැනි ඇට වර්ගයක තේ ඇට 100ක් හා කුඩා ප්‍රමාණයේ පොලිතීන් මලු 10කි.

10 ඇට මලු 9ක් ගැට ගසා සාදා ගන්න.

අභ්‍යාසය 1 : 51 26 70 64 95 යන එක් එක් සංඛ්‍යාව ඉරටුවලින් හෝ ඇටවලින් හෝ පෙන්වන්න. පහත නිදසුන බලන්න.

| සංඛ්‍යාව | මුළු ඉරටු ගණන | | මුළු ඇට ගණන | |
|---|---|---|---|---|
| | 10 ඉරටු මිටි | ඉරටු | 10 ඇට මලු | ඇට |
| 37 |  |  |  |  |

# සංඛ්‍යා එකතු කරමු

## 2.3 සංඛ්‍යා එකතු කරමු

පැවරුම :
මෙම වගුවේ එක් එක් පේළියේ සංඛ්‍යාව එක් එක් තීරයේ සංඛ්‍යාවට එකතු කර පේළි - තීර හමු වන කොටුවේ ලියන්න.
නිදසුන බලන්න.
පේළිය 7 + තීරය 8 = 15

තීර ↓

| + | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | 15 | |
| 8 | | | | | |
| 9 | | | | | |
| | | | | | |

පේළි →

**අභ්‍යාසය**

පේළි - තීර සංඛ්‍යා දෙකෙහි එකතුව පේළි-තීර හමු වන කොටුවේ ලියන්න.
නිදසුන බලන්න.
පේළිය 8 + තීරය 9 = 17

| + | 5 | 1 | 8 | 4 | 2 | 7 | 9 | 3 | 6 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2 | | | | | | | | | |
| 7 | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 9 | | | | | | | | | |
| 1 | | | | | | | | | |
| 5 | | | | | | | | | |
| 8 | | | | | | | 17 | | |
| 6 | | | | | | | | | |
| 3 | | | | | | | | | |

# සංඛ්‍යා ගුණ කිරීම

## 4.1 2 හි ගුණන වගුව මතක් කර ගනිමු

**අභ්‍යාසය 1**

2හි ගුණනවලින් හිස් තැන් පුරවන්න.

(1) 5 x 2 = ☐ (2) ☐ x 2 = 16

(3) 10 x 2 = ☐ (4) 9 x 2 = ☐

(5) ☐ x 2 = 14 (6) 3 x 2 = ☐

(7) ☐ x 2 = 12 (8) ☐ x 2 = 8

**අභ්‍යාසය 2**

කොටුව තුළ පිළිතුරු ලියන්න.

(1) දෙකේ ඒවා කීයක් දහය ද? ☐

(2) දෙකේ ඒවා නමයක් කීය ද? ☐

(3) දෙකේ ඒවා කීයක් දාහතර ද? ☐

(4) දෙකේ ඒවා කීයක් දහසය ද? ☐

(5) දෙකේ ඒවා හයක් කීය ද? ☐

(7) දෙකේ ඒවා කීයක් දහඅට ද? ☐

(8) දෙකේ ඒවා කීයක් අට ද? ☐

# සංඛ්‍යා රටා

## 6.3 රටාවකට රූප අඳිමු

4cm x 3½ cm පමණ වූ තරමක් ගත පත්‍රිකා 5ක පහත දැක්වෙන හැඩ ඇඳ, කපා ඉවත් කර, හිඩැස් පත් පිළියෙල කර ගන්න.

**හිඩැස් පත්**



1 2 3 4 5

පැවරුම : හිඩැස් පත් 2 බැගින් තෝරා ගෙන, හැඩ පහක් සහිත, එකිනෙකට වෙනස් රූප රටා 5ක් අඳින්න.

නිදසුන :  ----------

**අභ්‍යාසය 1**

එක් එක් රූප රටාවේ ඊ ළඟට ආ යුතු රූපය තිත් රේඛාව මත අඳින්න.

(1)  ...............

(2)  ...............

(3)  ...............

(4)  . . . . . . . . .

**අභයාසය 2**

වරහන් තුළ ඇති රූප දෙකෙන් ගැළපෙන රූපය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) 

(2) 

(3) 

(4) 

(5) 

# ඝන වස්තු හා හැඩතල

## 11.2 ඝනවස්තුවල ලක්ෂණ හඳුනා ගනිමු.



ඝනකාභය



ඝනකය



චතුස්තලය

ඉහත ඝනවස්තුවල ආකෘති 3 ක් තරමක් ඝන කඩදාසියකින් කපා අලවා සකස් කර ගන්න.

වරකට එක ඝනවස්තුවක් බැගින් ගන්න. එහි

* පැති සමතල ද? සමතල නැද්ද?
* පැති ගණන කීය ද?
* දාර කෙළින් ද? වක්‍ර ද?
* මුල්ලක දී දාර කීයක් එකිනෙක හමු වේ ද?
* මුලු ගණන කීය ද?

යන ප්‍රශ්න ඉදිරිපත් කරන්න. එක් එක් ලක්ෂණය ගැන සාකච්ඡා කරන්න.

පහත වගුවේ හිස්තැන් පුරවන්න. නිදසුන් බලන්න.

| ලක්ෂණය | ඝනකාභය | ඝනකය | චතුස්තලය |
|---|---|---|---|
| පැති සමතල බව | ---------- | -------- | සමතල |
| පැති ගණන | 6 | -------- | ------ |
| දාර කෙළින් බව | | කෙළින් | ------- |
| දාර ගණන | -------- | -------- | 9 |
| මුලු ගණන | -------- | 8 | ------ |

# සංඛ්‍යා - අඩු කිරීම

## 3.3 18 ට නොවැඩි සංඛ්‍යාවකින් තනි ඉලක්කමේ සංඛ්‍යාවක් අඩු කරමු.

තනි ඉලක්කමේ සංඛ්‍යා දෙකක එකතුව දැක්වෙන මෙම වගුව බලන්න. පේළි තීර මුල් සංඛ්‍යාවල එකතුව ඒ ඒ කොටුවේ දැක්වෙයි.

එකතුව 10 ට වැඩි ප්‍රදේශයේ වටය තුළ ඇති 13 බලන්න. පේළිය 5 සහ තීරය 8හි ප්‍රතිඵලය යි ඒ. 5 + 8 = 13 වේ.

තීර

| + | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | **8** | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | **9** | 10 |
| 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | **10** | 11 |
| 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | **11** | 12 |
| 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | **12** | 13 |
| **5** | **6** | **7** | **8** | **9** | **10** | **11** | **12** | **13** | 14 |
| 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 |
| 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |
| 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |

පේළි

අනෙක් අතට 13 න් 5ක් (පේළිය 5) අඩු කළ විට පිළිතුර (තීරය 8) පෙන්වයි මෙසේ 18 තෙක් වූ සංඛ්‍යාවකින් තනි ඉලක්කමේ සංඛ්‍යාවක් අඩු කළ විට ලැබෙන සංඛ්‍යාව ද මෙම වගුවෙහි දැක්වෙයි.

**අභ්‍යාසය**

පහත පෙනෙන අඩු කිරීමේ වගුව සම්පූර්ණ කරන්න. තීරයේ සංඛ්‍යාවෙන් පේළියේ සංඛ්‍යාව අඩු කරන්න.

නිදසුන බලන්න
13 - 8 = 5

| - | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 9 | | | | | | | | | |
| 8 | | | | 5 | | | | | |
| 7 | | | | | | | | | |
| 6 | | | | | | | | | |
| **5** | | | | | | | | | |
| 4 | | | | | | | | | |
| 3 | | | | | | | | | |
| 2 | | | | | | | | | |
| 1 | | | | | | | | | |

වගුව අඩු කිරීම

# සංඛ්‍යා බෙදීම

## 5.1 ද්‍රව්‍ය සම සම ව බෙදමු

දෙදෙනකු අතර මදටිය ඇට 20 ක් හෝ එවැනි ද්‍රව්‍ය සංඛ්‍යාවක් සමසේ බෙදා ගනු ලබන්නේ කෙසේ දැයි බලමු.

ළමයි 2 කු ඉදිරියට කැඳවා මදටිය ඇට 20 ඔවුන් දෙදෙනා අතර තබන්න.

මේක මට මේක ඔයාට යනුවෙන් දෙදෙනාට ම වරකට ද්‍රව්‍යය බැගින් ලබා ගැනීමට ඉඩ සලසන්න- මෙසේ ද්‍රව්‍ය ප්‍රමාණය අවසාන වන තෙක් බෙදා ගැනීමට ඉඩ හරින්න.

අවසානයේ දී දෙදෙනාට ම සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් ලැබී තිබෙනු ඇත.

එනම් ද්‍රව්‍ය 10 බැගින් ලැබී තිබෙනු ඇත.

**අභ්‍යාසය**

ද්‍රව්‍ය 30ක් /මදටිය ඇට 30ක් ඉදිරිපත් කර මෙලෙස 3 දෙනකු අතර සම සේ බෙදා ගැනීමට සලස්වන්න.

# මිනුම් - දිග හා දුර

## 7.3 මීටර කෝදුව හඳුනා ගනිමු

දිග මැනීමේ සම්මත ඒකකය මීටරය යි.
මීටර කෝදුව හොඳින් නිරීක්ෂණය කරන්න.
එය කුඩා කොටස් කීයකට බෙදා තිබේ ද?
දෙ අත් විහිදුවා ලූ විට
ලැබෙන දිග මීටරයකට වඩා වැඩි ද? අඩු දැයි බලන්න.

පොල්පිති නාරටියකින් හෝ ලී කෝටුවකින් හෝ මීටරයක් දිග කෝදුවක් කපා ගන්න.
දිග යටතේ සඳහන් පළල හෝ උස හෝ එම කෝදුවෙන් මැන පහත වගුව සම්පූර්ණ කරන්න.

වගුව

| දිග | මීටරයකට අඩු සමාන වැඩි බව |
|---|---|
| මේසයක උස | අඩු |
| ඇඳක පළල | ------------- |
| පුටුවක උස | ------------- |
| අල්මාරියක පළල | ------------- |
| මගේ උස | ------------- |
| මල්ලිගේ / නංගිගේ උස | ------------- |

# පරිමාව හා ධාරිතාව

## 8.2 ආසන්න ලීටරයට මනිමු

ලීටරයේ හිස් පැණි බීම බෝතලයක්, ජලය බඳුනක් ගැලුමේ හිස් කෑන් එකක් (හැකිනම්) , කුඩා ප්ලාස්ටික් කෝප්පයක්, පුනීලයක් සහ අත් පිස්නා රෙදි කැබැල්ලක් යන මේවා සපයා ගන්න.

බාල්දියේ ඇති ජලය පුනීලය ආධාර කරගෙන ලීටරයේ බෝතලයෙන් මැනීමට සලස්වන්න. අවසාන ජල ප්‍රමාණය **බෝතල බාගයක් හෝ ඊට වැඩි ප්‍රමාණක් නම් එය බෝතලයක් ලෙස** සැලකීමට යොමු කරන්න.

ගැලුමේ හිස් කෑන් එකකට (සපයා ගත හැකි නම්) අල්ලන ජල ලීටර ප්‍රමාණය සෙවීමට සලස්වන්න.

ලීටරයක දියර උස සමාන කොටස්
4ක නැමුම් මායිම් පෙන්වන කඩදාසි
බෝතලයේ පිටත අලවා ගන්න.

ක්‍රමාංකිත ලීටරයේ බෝතලය     ජලය සහිත බාල්දිය     පුනීලය

පැවරුම

(i) ලීටරයේ බෝතලයක හා සාමාන්‍ය බෝතලයක ජල පරිමා සසඳන්න.

(ii) ජලය ලීටරයකට පිරිසි කෝප්ප කොපමණ ගණනක් අල්ලන්නේ දැයි සොයන්න.

(iii) ලීටරයේ බෝතලයෙන් ජලය ලීටර 3ක් ලොකු බඳුනකට මැන ගන්න. එහි සාමාන්‍ය බෝතල් කීයක් තිබේ දැයි සොයන්න.

# මුදල්

## 10.3 ඉතිරි මුදල සොයමු

(1.0) රුපියල් 10 කට අඩු බඩු මිල දී ගත් විට රුපියල් 10න් ලැබෙන ඉතුරු මුදල සොයන්න.

**බඩුවල මිල**

- මකනය රුපි. 3
- පැන්සලය රුපි. 5
- ටොෆිය රුපි. 2
- හුණු කූර රුපි. 1
- ලේන්සුව රුපි. 5
- කෝදුව රුපි. 4
- පැන්සල් උල්කරණය රුපි. 3
- ගිනිපෙට්ටිය රුපි. 4

**වගුව**

| බඩු දෙකක මිල | | මිල එකතුව | රුපියල් 10ක් වීමට එකතු කළ යුතු ගණන | ඉතුරුව රුපියල් |
|---|---|---|---|---|
| රුපියල් | රුපියල් | | | |
| 5 | 2 | 7 | 1 + 2 | 3 |
| 4 | 4 | 8 | 1 + 1 | 2 |
| 4 | 5 | --- | ------- | ---- |
| 2 | 3 | --- | ------- | ---- |
| 3 | 4 | --- | ------- | ---- |
| 5 | 3 | --- | ------- | ---- |
| 3 | 3 | --- | ------- | ---- |

(2.0) එකතුව 10 ක් වන සංඛ්‍යා යුගළ ඉරකින් යා කරන්න-.



# ප්‍රස්තාර

## 12.1 තොරතුරු රූපික ව දක්වමු

සිටින ළමයි සංඛ්‍යාවට සමාන 6cm x 4cm ප්‍රමාණයේ තරමක් ගන පත්‍රිකා කිහිපයක් කපා ගන්න.



අඹ අන්නාසි පැපොල්

මෙම පලතුරු වර්ග 3හි රූපය බැගින් එම පත්‍රිකාවල අඳින මෙන් උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම :**
අපි වැඩියෙන් ම කැමැති පලතුර පිළිබඳ තොරතුරු රූප මගින් දැක්වීමට යන බව කියන්න.




කොටු සැලැස්ම

පලතුරක නමින් ඒ ඒ තීරය හඳුන්වන මෙහි පෙන්වන විදියේ තීර 3 ක කොටු සැලැස්මක් තරමක් ලොකු කඩදාසියක ඇඳ ඉදිරිපත් කරන්න. වරකට එක් අයකු බැගින් ඉදිරියට පැමිණ පලතුරු වර්ග 3න් වඩාත් කැමති පලතුරෙහි රූපය රූප පත්‍රිකා අතරින් තෝරා කොටු සැලැස්මෙහි අදාළ තීරයෙහි පහළ සිට ඉහළට අලවන මෙන් උපදෙස් දෙන්න.




චිත්‍ර ප්‍රස්තාරය

මෙය චිත්‍ර ප්‍රස්තාරයක් ලෙස හැඳින්විය හැකි බව දන්වන්න. **අපි වැඩියෙන් ම කැමැති පලතුර** නමින් එය නම් කරන්න.

මෙවැනි ප්‍රස්තාරයකින් ඒ ඒ පලතුර ට වැඩි මනාපයක් දක්වන ළමයි සංඛ්‍යා පහසුවෙන් සැසදිය හැකි බව දන්වා පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න කිහිපයකට උත්තර ප්‍රස්තාරය ඇසුරෙන් ලබා ගන්න.

(1) පැපොල්වලට වඩා අඹවලට කැමැති ළමයි සංඛ්‍යාව කීය ද?
(2) වැඩි දෙනෙක් කැමැති පලතුර කුමක් ද?
(3) අඩු මනාපයක් දක්වන පලතුර කුමක් ද?

## 1.5 නාමය හා සංඛ්‍යාංකය හඳුනා ගනිමු

පහත සටහන බලන්න




එක් එක් ඉලක්කමේ ස්ථානීය අගය දක්වන්න.

(1)

| සංඛ්‍යා නාමය | සංඛ්‍යාංකය | | |
|---|---|---|---|
| | සියස්ථානය | දහයස්ථානය | එකස්ථානය |
| දෙසිය තිස්පහ | 2 | 3 | 5 |
| හාරසිය අනූනවය | | | |
| අටසිය අසූ අට | | | |
| නමසිය හැට | | | |
| හත්සිය එක | | | |
| හය සියය | | | |

(2) පිහිටි ස්ථානය අනුව එක් එක් ඉලක්කමේ අගය දක්වන්න.

| සංඛ්‍යාංකය | ස්ථානය අනුව ඉලක්කමේ අගය | | |
|---|---|---|---|
| | සියස්ථානය | දහයස්ථානය | එකස්ථානය |
| 432 | 400 | 30 | 2 |
| 697 | | | |
| 555 | | | |
| 810 | | | |
| 704 | | | |
| 900 | | | |

# සංඛ්‍යා එකතු කිරීම

## 2.4 ඉලක්කම් 2 සංඛ්‍යාවකට 10ක් එකතු කරමු

සියයේ කොටුව

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |
| 51 | 52 | 53 | 54 | 55 | 56 | 57 | 58 | 59 | 60 |
| 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 |
| 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 |
| 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 91 | 92 | 93 | 94 | 95 | 96 | 97 | 98 | 99 | 100 |

1 සිට 100 තෙක් සංඛ්‍යාංක දැක්වෙන පේළි 10ක් හා තීර 10ක් ඇති මෙම කොටුවට **"සියයේ කොටුව"** යයි කියමු.

කොටුවක ඇති ඕනෑ ම සංඛ්‍යාවක් තෝරා ගන්න. ඊට යාබද පහළ කොටුවේ ඇති සංඛ්‍යාව, එම සංඛ්‍යාවට වඩා කීයක් වැඩි ද?

නිදසුන : තෝරා ගත් කොටුව 36
යාබද පහළ කොටුව 46
වෙනස 46 - 36 = 10
36ට වඩා 10 ක් වැඩි ය.

**අභ්‍යාසය :**

**"සියයේ කොටුව"** ඇසුරෙන් එකතුව සොයන්න.

(1) (1) 33 + 10 = ☐ (2) 19 + 10 = ☐ (3) 68 + 10 = ☐

(4) 41 + 10 = ☐ (5) 90 + 10 = ☐ (6) 27 + 10 = ☐

(2)

| (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|
| 10 | 27 | 40 | 76 | 10 | 20 |
| +52 | +10 | +10 | +10 | +45 | +30 |
| ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ |

# සංඛ්‍යා

## 4.2 සරල ගැටලු විසඳමු

නිදසුන : පැකට්ටුවක බිස්කට් 8ක් ඇත. එවැනි පැකට්ටු 2ක ඇති බිස්කට් ගණන කොපමණ ද?

ගැටලුවේ තොරතුරු මෙසේ නිරූපණය කරමු

| x x x x<br>x x x x | x x x x<br>x x x x |
|---|---|

මෙහි විසඳුම 8 x 2 න් ලබා ගත හැකි ය.

පැකට් 2 ම ඇති බිස්කට් ප්‍රමාණය = 8 x 2

= 16//

පහත සඳහන් ගැටලු විසඳන්න.

**අභ්‍යාසය 1**

(1) එක ළමයකුට ගෙඩි 2 බැගින් ළමයි 10 දෙනකුට දීමට රඹුටන් ගෙඩි කීයක් අවශ්‍ය ද?

(2) කෝලිකුට්ටු කෙසෙල් ගෙඩියක් රුපියල් 8ක් වේ. එවැනි ගෙඩි 2ක මිල කොපමණ ද?

(3) එක්තරා දුරක් බසයෙන් යෑමට එක් අයකු රුපියල් 9ක් ගෙවිය යුතු ය. දෙදෙනකුට එම දුර යාමට ගෙවිය යුතු බස් ගාස්තුව කොපමණ ද?

(4) එක ළමයකුට පොත් 2 බැගින් ළමයින් 6 දෙනෙකුට දීමට පොත් කීයක් අවශ්‍ය වේ ද?

(5) මිනිසකුට දිනක දී කාණුවකින් මීටර 8ක් දිග කොටසක් කැපිය හැකි ය. දින 2ක් තුළ ඔහුට කැපිය හැකි කාණුවේ මුළු දිග කොපමණ ද?

# මිනුම් - කාලය

## 9.3 උදය, දහවල, සවස සහ රැයහි වේලාවල් සමග දවසේ සිද්ධි ගළපමු.

මේසය මත තබන  ඔරලෝසුවක් වේලාව 6ට සකස් කර ඉදිරිපත් කර එය උදේ 6 හෝ සවස 6 හෝ විය හැකි බව දන්වන්න.

**උදේ 6** වන විට දරුවන් කරන දේ පිළිබඳ විමසන්න.
උදය නැගිටීම, මූණ සේදීම පාඩම් කිරීම වැනි දේ ඉදිරිපත් වනු ඇත.

**සවස 6 ට** ඔවුන් කරන දේ පිළිබඳ විමසන්න.
මේ අනුව උදේ 7 ට, උදේ 8 ට සිදුවන දේවල් හෝ දරුවන් කරන දේ පිළිබඳ විමසන්න.

දවසේ එක් එක් වේලාව තුළ කරන දේවල් පිළිබඳ ලැයිස්තුවක් අවසානයේ ගොඩනගන්න.

උදේ 6 - පිබිදීම

උදේ 7 - උදය ආහාර ගැනීම

උදේ 8 - පාසලෙහි ඉගෙනුම ලැබීම

උදේ 10 - පාසල් විවේක කාලය

සහවල් 12 - කිසියම් විෂයයක් ඉගෙන ගනු ලැබිම

දහවල් 1

දහවල් 1.30 - පාසල් කාලය අවසන් වීම

දහවල් 2 - දහවල් ආහාරය ගැනීම

සවස 4 - සෙල්ලම් කිරීම

සවස 6 - පාඩම් කටයුතුවල යෙදීම

රාත්‍රි 8 - රාත්‍රි ආහාරය ගැනීම

රාත්‍රි 9 - රාත්‍රි නින්දට යෑම

# සංඛ්‍යා අඩු - කිරීම

## 3.4 ගෙන ඒම රහිත අවස්ථාවක සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කිරීම.

නිදසුන : 65 න් 42 ක් අඩු කරන්න.




ගණක පෙත

| | | | | |
|---|---|---|---|---|
| 65 → | 60 | + | 5 | |
| - 42 → | 40 | + | 2 | |
| 23 ← | 20 | + | 3 | |

බව ගණක පෙතෙහි "කොටු තීරු" සහ "කොටු" මගින් පෙන්වයි.

(1) ද එ: 9 5 - 8 4

(2) ද එ: 7 4 - 2 1

(3) ද එ: 6 7 - 3 4

(4) ද එ: 4 9 - 1 1

(4) ද එ: 8 5 - 2 5

(5) ද එ: 7 7 - 6 0

(6) ද එ: 2 7 - 7 7

(4) ද එ: 5 6 - 5 2

නිදසුන

ද එ: 6 5 - 4 2

# බෙදීම

## 5.2 ඉතුරුවක් නොලැබෙන සංඛ්‍යා 2න් බෙදමු.

නිදසුන :

වෙරළු ගෙඩි 10ක් දෙදෙනකු අතර සම සේ බෙදා දුන් විට එක් අයකුට ලැබෙන වෙරළු ගෙඩි ගණන කීය ද?

එක් අයකුට ලැබෙන වෙරළු ගෙඩි ගණන = 10 ÷ 2
= 5//

අභ්‍යාසය 1 : මෙම ගැටලු විසඳන්න.

(1) අඹ ගෙඩි 84 ක් මලු දෙකක සම සම ව අසුරන ලදි. එක මල්ලක තිබෙන අඹ ඩේ ගණන කීය ද?.

(2) තේ කෝප්ප 2කට රුපියල් 24ක් අය කරනු ලැබුවේ නම් එක තේ කෝප්පයකට අය කළ මුදල සොයන්න.

(3) මල්ලි මෙන් දෙගුණයක් අයියා වයස ය. අයියාගේ වයස අවුරුදු 20ක් වේ නම් මල්ලිගේ වයස කොපමණ ද?

(4) කාමරයක් 8m දිග වන අතර එය පළල මෙන් දෙගුණයක් වේ. කාමරයේ පළල කොපමණ ද?

(5) විස්කෝතු පැකට්ටු දෙකක් රුපියල් 68ක් වේ නම් එක පැකට්ටුවක මිල කොපමණ ද?

# සංඛ්‍යා රටා

## 6.4 සංඛ්‍යා රටා හඳුනා ගනිමු

යහළුවන් සමග කරන සෙල්ලමක දී කෙනකු අලුතෙන් තෝරා ගැනීමට හෝ ඉවත් කර ගැනීමට හෝ ඔබ කියන "හෝ දහය, විස්ස, තිහ, හතලිහ, ---- පනහ, හැට, හැත්තෑව, අසූව, අනූව සියය" යන සංඛ්‍යා නාම ඇති සංඛ්‍යාංක තීරය මෙම සියය කොටුවෙහි (අඳුරු කර ඇති) බලන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 |
| 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 |
| 41 | 42 | 43 | 44 | 45 | 46 | 47 | 48 | 49 | 50 |
| 51 | 52 | 53 | 54 | 55 | 56 | 57 | 58 | 59 | 60 |
| 61 | 62 | 63 | 64 | 65 | 66 | 67 | 68 | 69 | 70 |
| 71 | 72 | 73 | 74 | 75 | 76 | 77 | 78 | 79 | 80 |
| 81 | 82 | 83 | 84 | 85 | 86 | 87 | 88 | 89 | 90 |
| 91 | 92 | 93 | 94 | 95 | 96 | 97 | 98 | 99 | 100 |

10 වෙනි තීරයේ ඇති 10, 20, 30, 40, -------- 100 එම සංඛ්‍යා ය. මෙහි යාබද සංඛ්‍යා 2ක් අතර වෙනස 10 ක් වේ. මෙය පොදු අන්තරය 10 ක් වන සංඛ්‍යා රටාවකි. ඉතුරු තීර 9 යෙහි පහළට ඇති සංඛ්‍යා එකින් එක බලන්න.

**අභ්‍යාසය 1**

පහත සඳහන් එක් එක් සංඛ්‍යාව පළමු වන සංඛ්‍යාව වන පොදු අන්තරය 10 වන සංඛ්‍යා රටා ලියන්න.

නිදසුන : 6 , 16, 26, 36, -------

(1) 19 (2) 43 (3) 1 (4) 5 (5) 59

**අභ්‍යාසය 2**

එක් එක් සංඛ්‍යා රටාවේ ඊ ළඟට ආ යුතු සංඛ්‍යාව කොටුව තුළ ලියන්න.

(1) 57, 47, 37, ------------ ☐

(2) 94, 84, 74, ------------ ☐

(3) 18, 28, 38, ------------ ☐

(4) 22, 32, 42, ------------ ☐

(5) 49, 39, 29, ------------ ☐

# සංඛ්‍යා රටා

## 8.3 ජල පරිමාවක් ආසන්න මිලිලීටර 100ට මනිමු

ලීටරයේ පැණි බීම හිස් බෝතලයක් සොයා ගන්න. දළ වශයෙන් එහි ලීටරයක ජලය උසට සමාන කඩදාසි තීරුවක් ගෙන සමාන කොටස් 10ට බෙදා බෝතලයේ පිටතින් අලවා ගන්න. ජලය මනින මිනුම් සරාවක් ලෙස මෙය හඳුන්වමු. රූපය බලන්න.

මිලිලීටර 100, 200 බෙහෙත් බෝතල් 2ක්
ලීටර 1 සහ $1\frac{1}{2}$ හිස් පැණි බීම බෝතල් 2ක්
ජලය සහිත බඳුනක්, පුනීලයක්, ප්ලාස්ටික්
කෝප්පයක් ගන මේවා සොයා ගන්න.

මිලිලීටර 100 හෝ 200 හෝ බෝතලයකින්
ජලය වත් කර ආදේශික මිනුම් සරාව දක්වන
ජල මට්ටම්වල නිවැරදිතාව තහවුරු කරවන්න.

ඉදිරිපත් කර ඇති හිස් බෝතල්වල ජල ධාරිතා මැනීමට යොමු කරවන්න.

**සාදා ගත් ලීටරයේ මිනුම් සරාව රූපය**

**පැවරුම**

පහත සඳහන් එක් එක් බඳුනෙහි (ධාරිතාව) ජල පරිමාව ආසන්න මිලිලීටර 100ට සොයන්න.

(1) පිරිසි කෝප්පය

(2) පීරිසිය

(3) කුඩා පැණි බීම බෝතලය

(4) ගෙවල්වල භාවිත කරන බෝතලය (ආසන්න මිලිලීටර 50ට)

(5) බෝතල් බාගය (ආසන්න මිලිලීටර 25ට)

(ලීටර *"l"* වලින් සහ මිලිලීටර *"ml"* වලින් හඳුන්වන බව කියා එම සංකේත දෙක ඉදිරිපත් කරන්න.)

# මුදල්

## 10.4 රුපියල් 10 සහ රුපියල් 20 නෝට්ටු හඳුනා ගනිමු

රූපය 1 රූපය 2

රූපය 1 නෝට්ටුවේ අගය රුපියල් කීය ද? ☐

රූපය 2 නෝට්ටුවේ අගය රුපියල් කීය ද? ☐

රුපියල් 10 සහ රුපියල් 20 සැබෑ නෝට්ටු යුගළ 2 ක් පමණ දරුවනට ඉදිරිපත් කරන්න.

නෝට්ටු 2 සීරුවෙන් පරීක්ෂා කර බැලීමට ඉඩ දෙන්න. ඒ ඒ ලක්ෂණය වගුවෙහි අදාළ හිස් කොටුව තුළ ලියන්න.

මුදල්
වගුව නෝට්ටුවල ලක්ෂණ

| ලක්ෂණය | රුපියල් 10 නෝට්ටුව | රුපියල් 20 නෝට්ටුව |
|---|---|---|
| පාට | කොළපාට | දම්පාට සහ ළා රතු පාට |
| ඉදිරිපස රූපය | | |
| සඳහන් භාෂා | | |
| නිකුත් කළ බැංකුව | | |
| නිකුත් කළ දිනය | | |
| අගය සඳහන් තැන් (ඉලක්කමෙන්) | | 5 |
| අගය සඳහන් තැන් (අකුරෙන්) | 2 | |

# ඝන වස්තු හා හැඩතල

## 11.3 සිලින්ඩරයක සහ ඝනකාභයක පැති, දාර සහ මුලු සසඳමු



සිලින්ඩරය



ඝනකාභය

හිස් කොටු තුළ අදාළ ගණන ලියන්න.

**සිලින්ඩරය** — **ඝනකාභය**

පැති ගණන ☐ ⟷ පැති ගණන ☐

පැති ☐ ක් සමතල
පැති ☐ ක් වක්‍ර } ⟷ පැති ☐ ම සමතල

දාර ගණන ☐ ⟷ දාර ගණන ☐

වක්‍ර දාර ⟷ කෙළින් දාර

මුලු නැත ⟷ මුලු ඇත

මුලු ගණන ☐ ⟷ මුලු ගණන ☐

☐

බෝලයක රූපයක් මෙහි දක්වේ. බෝලය හැඩය ඇති ඝනවස්තුවකට ගෝලය යයි කියමු. වීදුරු බෝලය ගෝලයකි.
දාර, මුලු ගෝලයක දක්නට නැත. මතුපිට සම්පූර්ණයෙන් ම රවුම් ය. වක්‍ර ය.

පැවරුම: පැති දාර සහ මුලු යන ලක්ෂණ යටතේ සිලින්ඩරය හා ගෝලය ඉහත කළ ආකාරයට සසඳන්න.

# දිශාව

## 13.1 ඉදිරිපස, පිටුපස වමත්පස හා දකුණත් පස හඳුනා ගනිමු

දරුවන් එළිමහනට ගෙන යන්න.
වමත , දකුණත, පිටුපස, ඉදිරිපස යන වචනවල තේරුම් දන්නේ දැයි පරීක්ෂා කර බලන්න. 'වමත පෙන්වන්න.' 'දකුණු අත පැත්තට හැරෙන්න' වැනි සරල විධනයකට දක්වන ප්‍රතිචාර කෙබඳු දැයි බලන්න.

"ඇණ තියා ගන්න." "වමතට හැරෙන්න" "දකුණතට හැරෙන්න" හා "ආපස්සට හැරෙන්න" වැනි සරල විධාන කිහිපයක් ඔවුන් ප්‍රබෝධමත් කිරීමට හා දක්වන ප්‍රතිචාර කෙබඳු දැයි බැලීමට දෙන්න.

**ක්‍රියාකාරකම**

දරුවන් ඉදිරියට මුහුණ ලා සිට ගැනීමට සලස්වන්න. ඔවුන්ගේ "දකුණු අත පැත්තේ" "වම් අත පැත්තේ" "ඉදිරියෙන් ඇති" "පිටුපසින් ඇති" "ඉදිරියෙහි හුඟාක් ම ඈතින් හා ළඟින් ඇති" වශයෙන් ඒ ඒ වස්තුව බැගින් නම් කිරීමට සෑම දරුවකුට ම අවස්ථාව ලබා දෙන්න.

පැවරුම :

ඔබ ඔවුන්ට මුහුණ ලා සිටින විට ඔබට සාපේක්ෂ ව ඒ ඒ දිශාවේ තිබෙන වස්තු දරුවන්ට නම් කළ හැකි දැයි බලන්න.

නිදසුන : ඔබගේ වම්පස දරුවන්ගේ දකුණුපස වේ.

# සංඛ්‍යා

## 1.6 1000ට තෙක් වූ සංඛ්‍යාවක් ද්‍රව්‍ය ඇසුරෙන් පෙන්වමු

පැවරුම :

පහත සඳහන් ප්‍රමාණවලින් ලොකු කොටුවක් කොටු තීරුවක් සහ කුඩා කොටුවක් යන මේවා එකකින් 9 බැගින් තරමක් ගන කඩදාසියකින් කපා ගන්න.



( 10cm x 10cm) 100 ලොකු කොටුව

( 10cm x 1cm) 10 කොටු තීරුව

( 1cm x 1cm) කොටුව

**නිදසුන :** ඉහත කඩදාසි කොටුවලින් 574 පෙන්වන අයුරු බලන්න.

| සංඛ්‍යාව | ලොකු කොටු සියයේ ඒවා | කොටු තීරු දහයේ ඒවා | කොටු එකේ ඒවා |
|---|---|---|---|
| 574 |  |  |  |

අභ්‍යාසය :

කොටු වර්ග තුන ඇසුරෙන් මෙම සංඛ්‍යා පෙන්වන්න.

(i) 2 3 8

(ii) 6 7 5

(iii) 8 4 0

(iv) 5 0 0

# සංඛ්‍යා - එකතු කිරීම

## 2.5 10 ගුණාකර සංඛ්‍යාවකට තනි ඉලක්කමේ සංඛ්‍යාවක් එකතු කරමු.

නිදසුන : 30 ට 7ක් එකතු කරන්න.
30 + 7 හි අගය සොයමු

නිදසුන

| | ද | එ |
|---|---|---|
| - | 3 | 0 |
| + | | 7 |
| | 3 | 7 |

හතලිහයි හතයි → හතලිස් හතයි
පනහයි හතයි → පනස් හත නිසා
තිහයි හතයි → තිස් හත යනුවෙන් මනෝමයෙන් ද උත්තරය ලබා ගත හැකි ය.

**අභ්‍යාසය**

එකතු කරන්න

(අ) (1) 50 + 6 = ☐ (2) 70 + 8 = ☐ (3) 20 + 9 = ☐
(4) 90 + 9 = ☐ (2) 60 + 4 = ☐ (3) 80 + 8 = ☐

(ඉ)

| (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|
| ද එ | ද එ | ද එ | ද එ | ද එ | ද එ |
| 7 | 3 0 | 6 0 | 9 | 6 | 2 0 |
| + 4 0 | + 9 | + 6 | + 8 0 | + 5 0 | + 9 |
| ☐ | ☐ | ☐ | ☐ | ☐ | ☐ |

# සංඛ්‍යා

## 4.3 5 ගුණන වගුව මතක් කර ගනිමු

හිස් කොටු තුළ ගැළපෙන සංඛ්‍යා ලියන්න.

**අභ්‍යාසය 1**

(1) 8 × 5 = ☐

(2) 4 × 5 = ☐

(3) ☐ × 5 = 35

(4) ☐ × 5 = 45

(5) ☐ × 5 = 25

(6) ☐ × 5 = 15

(7) 6 × 5 = ☐

(8) 10 × 5 = ☐

**අභ්‍යාසය 2**

පිළිතුර හිස් කොටුව තුළ ලියන්න.

(1) 5 ඒවා කීයක් 15ක් වේ ද? ☐

(2) 5 ඒවා 8ක් කීය ද? ☐

(3) 5 ඒවා කීයක් 40 ක් වේ ද? ☐

(4) 5 ඒවා 9ක් කීය ද? ☐

(5) 5 ඒවා කීයක් 35ක් වේ ද? ☐

(6) 5 ඒවා 4ක් කීය ද? ☐

(7) 5 ඒවා කීයක් 25ක් වේ ද? ☐

(8) 5 + 5 + 5 + 5 + 5 + 5 හි අගය කීය ද? ☐

# මිනුම් - දිග හා දුර

## 7.4 මීටරවලින් මනිමු

අභ්‍යාසය පොතක කොළයක් ගන්න. පහත පෙනෙන විදියට හෝ කැමති විධියකට හෝ කඩදාසි රොකට්ටුවක් සාදා ගන්න.

රොකට්ටුව සාදා ගැනීමට වැඩිහිටි කෙනකුගේ උදවු ලබා ගන්න.

දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. එළිමහන් තැනකට ගොස් රොකට්ටුව අහසේ පා කර හැරීමට ඉහළට විදින්න. එය බිමට වැටෙන තැන ලකුණු කරන්න. මුලින් සිටි තැනත් බිමට වැටුණු තැනත් අතර කෝටුවකින් කෙළින් ඉරක් අදින්න. නැතිනම් ලණුවක් අදින්න. එම ඉර දිගේ හෝ ලණුව දිගේ

රොකට්ටු විදින දරුවන්ගේ රූපය

රොකට්ටුව ගිය දුර මීටරයක් දිග කෝටුවකින් මනින්න. මීටර ගණන සටහන් කර ගන්න.

වැඩි ම විද්ද දුර ප්‍රමාණය මීටර කීයද?

# මිනුම් - කාලය

## 9.4 මිනිත්තු කටුව 6ට යොමුව ඇති අවස්ථාවක දී වේලාව කියවමු.

මේසය මත තබන ඔරලෝසුවක් සපයා ගන්න. මිනිත්තු කටුව 12 දෙසට යොමුව ඇති විටක දක්වන වේලාව නැවත පුනරීක්ෂණය කරන්න.




මිනිත්තු කටුව 12 සිට සම්පූර්ණ වටයක් ගොස් නැවත 12ට පැමිණෙන විට පැය කටුව ගමන් කරන ප්‍රමාණය නිරීක්ෂණය කිරීමට සලස්වන්න. මිනිත්තු කටුව 12 සිට 6ට පැමිණෙන විට වට බාගයක් එන බවත් පැය කටුව ඊට සමගාමී ව සංඛ්‍යාංක 2ක් අතර පිහිටන බවත් නිරීක්ෂණය කිරීමට සලස්වන්න.

මේ අනුව පැය කටුව සම්පූර්ණ පැයකින් බාගයක් යන බව දන්වන්න.

මෙහි දැක්වෙන ඔරලෝසු මුහුණතෙන් වේලාව 1 පසු වී පැය $\frac{1}{2}$ ගොස් ඇති බවත් එය **එකහමාර** ලෙස කියන බවත් ඉදිරිපත් කරන්න. ඔරලෝසුවේ මිනිත්තු කටුව 6ට යොමු කර වේලාවල් කිහිපයක් කියවීමට යොමු කරන්න.

**අභ්‍යාසය 1**

එක් එක් වේලාව කීය දැයි හිස් කොටුව තුළ ලියන්න.



# සංඛ්‍යා - අඩු කිරීම

## 3.5 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කිරීම ගණක රාමුවකින් පෙන්වමු

නිදසුන : 67 - 32 හි අගය සොයන්න.
ගණක රාමුවක 67 - 32 හි අගය පෙන්වන අවස්ථා 3 බලන්න.




67 (රූපය 1) | (67 - 32) (රූපය 2) | 35 (රූපය 3)

රූපය 1 - ගණක රාමුවේ 67 පෙන්වයි.
රූපය 2 - 32 ක් අඩු කිරීමට ඒ ඒ කූරෙන් ඉවත් කළ යුතු ගණක ළා පාටින් දක්වයි.
රූපය 3 - (67 - 32) හි අගය 35 පෙන්වයි.

**අභ්‍යාසය 1**
එක් එක් ගණක රාමුවේ ඊට පහළින් ඇති සංඛ්‍යාව නිරූපණය කරන්න.
**නිදසුන**




57 | 352 | 470 | 63




7

**අභ්‍යාසය 2**

ගණක රාමු යුගළයෙහි පළමු වැන්නෙහි දක්වෙන සංඛ්‍යාවෙන් අඩු කිරීම කළ විට ඉතුරු සංඛ්‍යාව දෙවැන්නෙහි පෙන්වන්න. පිළිතුර ☐ තුළ ලියන්න.




54 (54-31)

23




75 (75 -34)

☐




65 (65 - 22)

☐




45 (45 20)

☐




56 (56- 36)

☐




50 (50-20)

☐

# සංඛ්‍යා රටා

## 6.3 100ට අඩු සංඛ්‍යාවක් 2න් බෙදමු.

අභ්‍යාසය 1

බෙදන්න

(1) 2 | 42 (2) 2 | 28 (3) 2 | 84 (4) 2 | 68

(5) 2 | 48 (6) 2 | 86 (7) 2 | 66 (8) 2 | 26

(9) 2 | 40 (10) 2 | 82 (11) 2 | 60 (12) 2 | 80

අභ්‍යාසය 2

බෙදන්න

(1) 2 | 43 (2) 2 | 27 (3) 2 | 49 (4) 2 | 87

(5) 2 | 85 (6) 2 | 41 (7) 2 | 61 (8) 2 | 89

# මුදල්

## 10.5 රුපියල් 20ට අඩු මුදලක් නෝට්ටු හා රුපියල් කාසිවලින් දක්වමු.

රුපියල් 15ක් නෝට්ටුවකින් හා කාසිවලින් දැක්විය හැකි විවිධ ආකාර පහත පෙන්වයි.

▭ 10 නෝට්ටුව ද ◯ රුපියල් කාසි ද නිරූපණය කරයි.




රුපියල් 18 නෝට්ටුවකින් හා කාසිවලින් දැක්විය හැකි විවිධ ආකාරවලට ගැළපෙන

▭ නෝට්ටු රූප හා ◯ රුපියල් කාසි රූප පහත පෙන්වයි.

අදාළ රුපියල් සංඛ්‍යාව ඒ ඒ කාසි රූපය තුළ ලියන්න.

නිදසුන බලන්න.



# සංඛ්‍යා

## 1.7 ගණක රාමුවක නිරූපිත සංඛ්‍යාවක් කියවමු.

ගණක රාමුවක රූපයක් පහත දැක්වේ. එහි එක් එක් කූරෙහි ඇති මුදු ගණන දෙස බලන්න.




හාරසියය හැට නමය

(1) එක් එක් ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව පහත හිස්කොටුව තුළ අකුරෙන් ලියන්න.




පන්සිය හතලිස් පහ

(2) එක් එක් සංඛ්‍යාවට ඉහළින් ඇති ගණක රාමුවේ ඇද එම සංඛ්‍යාව නිරූපණය කරන්න.



# සංඛ්‍යා - එකතු කිරීම

## 2.6 ඉලක්කම් 2 සංඛ්‍යාවකට තනි ඉලක්කමේ සංඛ්‍යාවක් එකතු කරමු.

**නිදසුන** 56 ට 7ක් එකතු කරන්න.
56 + 7 හි අගය සොයමු.

**පළමුවෙනි ක්‍රමය**

ගණක 7ක් හෝ අතේ ඇඟිලි 7 ක් හෝ ඇසුරෙන් 56 සිට ඉදිරියට 63 තෙක් පිළිවෙළින් 7 ක් ගණන් කර අගය ලබා ගන්න.

ඒ අනුව 56 + 7 = 63

**දෙවෙනි ක්‍රමය**

7 = 4 + 3 නිසා 56 + 4 = 60 , තව 3ක් 60ට එකතු කළ විට
60 + 3 = 63
56 + 7 = 63//

**තුන්වෙනි ක්‍රමය**

6ට 7ක් එකතු කළ විට 13 යි 13 හි
දහයේ ඒවා 1 යි එකේ ඒවා 3 යි
'ද' තීරයට 1 ක් 'ගෙන යාම' ට
පසු 5ට 1ක් එකතු කළ විට 6 උත්තරය 63 යි.

නිදසුන

| | ද | එ |
|---|---|---|
| - | 1 | |
| | 5 | 6 |
| + | | 7 |
| | 6 | 3 |

**අභ්‍යාසය**

එකතු කරන්න.

(1) 32 + 6 = ☐ (2) 74 + 5 = ☐

(3) 86 + 5 = ☐ (4) 27 + 7 = ☐

(5) 79 + 8 = ☐ (6) 49 + 9 = ☐

(7)

| | ද | එ |
|---|---|---|
| | 2 | 6 |
| + | | 4 |
| | ☐ | |

(8)

| | ද | එ |
|---|---|---|
| | 3 | 9 |
| + | | 7 |
| | ☐ | |

(9)

| | ද | එ |
|---|---|---|
| | | 8 |
| + | 5 | 7 |
| | ☐ | |

(10)

| | ද | එ |
|---|---|---|
| | | 6 |
| + | 7 | 6 |
| | ☐ | |

# ගුණ කිරීම

## 4.4 සරල ගැටලු විසඳමු.

නිදසුන : පේළියක පුටු 5 බැගින් පේළි 8 ක තැබීමට පුටු කීයක් අවශ්‍ය ද?



මෙහි විසදුම 8 x 5න් ලබා ගත හැකි ය.

අවශ්‍ය පුටු ගණන 8 x 5 = 40 ක් වේ.

පහත සඳහන් ගැටලු විසඳන්න.

**අභ්‍යාසය 1**

(1) පන්තියක සිසුන් 5 දෙනා බැගින් කණ්ඩායම් 6ට බෙදනු ලැබුයේ නම් සිටින සිසු සංඛ්‍යාව සොයන්න.

(2) එකක් 5kg බර හාල් පැකට්ටු 10ක් කොපමණ බර ද?

(3) එකක ටොෆි 8 බැගින් පැකට් 5ක ඇති ටොෆි ගණන සොයන්න.

(4) බුලත් විඩක මිල රුපියල් 10ක් වේ නම් එවැනි බුලත් විඩි 5ක මිල කොපමණ වේ ද?

(5) මෝටර් රථයක මගින් 4 දෙනකුට ගමන් කළ හැකි ය. එවැනි මෝටර් රථ 5ක ගමන් කළ හැකි මුළු මගින් සංඛ්‍යාව සොයන්න.

# සංඛ්‍යා රටා

## 6.5 පොදු අන්තරය 5 සංඛ්‍යා රටා හඳුනා ගනිමු.

සංඛ්‍යා රටා පාඩමේ දී හමු වූ
“සියයේ කොටුවේ” තීර 2ක් මෙහි දැක්වේ.




ඊතලවලින් අනුපිළිවෙළට පෙන්වන
සංඛ්‍යා මෙසේ ය.

5 , 10, 15 , 20, 25, ----- 95 100 වේ.
පොදු අන්තරය 5ක් වන සංඛ්‍යා රටාවකි.

5 ගුණන වගුවේ පහේ ගුණාකාර ද සංඛ්‍යා රටාවක්
ලෙස හැඳින්විය හැකි ය.

සියයේ කොටුවේ
1 තීරය ; 6 තීරය
2 තීරය ; 7 තීරය යන තීර යුගළවල ඇති
සංඛ්‍යා පිළිබඳ ව ද ඔබට කුමක් කිව හැකි ද?

නිදසුන

1 තීරය

6 තීරය




1, 6, 11, 16, ......,.......,........., 86 91 96 යනු පොදු අන්තරය 5 වන සංඛ්‍යා රටාවකි.

**අභ්‍යාසය 1**

එක් එක් සංඛ්‍යා රටාවේ ඊ ළඟට ආ යුතු සංඛ්‍යාව කොටුව තුළ ලියන්න.

(1) 7, 12, 17, 22, ..................

(2) 14, 19, 24, 29, ..................

(3) 71, 76, 81, 86, ..................

(4) 37, 32, 27, 22, ..................

(5) 93, 88, 85, 78, ..................

# ඝන වස්තු හා හැඩතල

## 11.4 ඝනවස්තුවල මුහුණත් ඇසුරෙන් ජ්‍යාමිතික හැඩ හඳුනා ගනිමු.



ඝනකාභය ඝනකය ප්‍රිස්මය සිලින්ඩරය

මේ එක් එක් ඝන වස්තුවේ උඩ පැත්ත (හරස්කඩ පැත්ත) අඳුරු කර ඇත. අඳුරු කළ පැති කඩදාසියක් මත තබා ඒවා වටා අඳිනු ලැබුවහොත් ලැබෙන තල රූප මෙසේ ය.



සෘජුකෝණාස්‍රය සමචතුරස්‍රය ත්‍රිකෝණය වෘත්තය

ජ්‍යාමිතික හැඩ ලෙස හඳුන්වන මේ එක් එක් රූපයේ හැඩය ද නම ද මතක තබා ගන්න.

අප අවට ඇති පරිසරයෙන් මේ එක් එක් හැඩයට නිදර්ශනය බැගින් ඉදිරිපත් කරන්න.

| සෘජුකෝණාස්‍ර හැඩය | සමචතුරස්‍ර හැඩය | ත්‍රිකෝණ හැඩය | වෘත්ත හැඩය |
|---|---|---|---|
| දොර | දාම් ලෑල්ල | කුරුපාව | ටින් පියන |
| | | | |
| | | | |

# ප්‍රස්තාර

## 12.2 සංඛ්‍යාමය තොරතුරු ප්‍රස්තාරයකින් පෙන්වමු

අවශ්‍ය දේ :-රතු පාට, නිල් පාට හා කොළ පාට වා‍‍ර්නිස් කොළවලින් කපා ගත් වර්ග සෙන්ටිමීටර 4 x 2 පමණ පාට කඩදාසි කැබලි එක් පාටකින් කැබලි 6 - 8ක් පමණ සූදානම් කර ගන්න. රතුපාට නිල්පාට සහ කොළ පාට යනුවෙන් තීර නම් කරන ලද කොටු සැලැස්මක් තරමක විශාල කඩදාසියක ඇඳ ගන්න.

රතු නිල් සහ කොළ යන ඒ ඒ පාටට වැඩි කැමැත්තක් දක්වන අය කොපමණ සිටිනවා ද යන්න රූපික ව පෙන්වීමට යන බව කියන්න. වරකට එක් දරුවකු කැඳවා තමා වඩාත් ඇලුම් කරන පාට සහිත කඩදාසි කැබැල්ල තෝරන ලෙස කියන්න. එය කොටු සැලැස්මේ පහත ම පේළියේ අලවන ලෙස කියන්න.




මෙම නිරූපණයට සුදුසු නමක් යෝජනා කිරීමට කියන්න. “අපි කැමති පාට” වැන්නක් සුදුසු ය.

ප්‍රස්තාරය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න අසන්න.

“වැඩි දෙනෙක් කැමති පාට මොකක් ද?”

“නිල් පාටට කී දෙනෙක් කැමති ද?”

“නිල් පාටට වඩා කොළ පාටට කී දෙනෙක් කැමැති ද?”

# සංඛ්‍යා - අඩු කිරීම

## 3.6 අඩු කිරීමට අදාළ සරල ගැටලු විසඳමු

**නිදසුන :** අඹ ගොඩක ඉදුණු අඹ 75ක් තිබුණි. එයින් 12ක් නරක් වී තිබුණි නම් ගොඩෙහි ඇති හොඳ අඹ ගෙඩි ගණන කීය ද?

ගැටලුව වගන්තියෙන් වගන්තිය කියවන්න. හොඳින් තේරුම් ගන්න.

මේ අනුව

මුළු අඹ ගණන = 75

නරක අඹ ගණන = 12

ඉතුරු හොඳ අඹ ගණන = 75 - 12

= 63//

| | ද | එ |
|---|---|---|
| - | 7 | 5 |
| | 1 | 2 |
| | 6 | 3 |

**අභ්‍යාසය 1**

විසඳන්න.

(1) මගේ ළඟ රුපියල් 15ක් ඇත. එයින් රුපියල් 12ක් වියදම් කළ පසු මට ඉතුරු වන මුදල කොපමණ ද?

(2) කිරි හලක කිරි පැකට් 96ක් තිබුණි. එක්තරා පැකට් ගණනක් විකිණීමෙන් පසු තව කිරි පැකට් 24ක් ඉතුරු ව තිබුණි. විකුණා ඇති කිරි පැකට් ගණන සොයන්න.

(3) පන්තියක ළමයි 37 දෙනකුගෙන් එක් දිනයක පැමිණි සිටි ගණන 31ක් විය. එදින නොපැමිණි ළමයි ගණන සොයන්න.

(4) පොල් ගෙඩි 48 න් ගෙඩි 26ක් විකුණූ පසු ඉතුරු වන පොල් ගෙඩි ගණන කීය ද?.

(5) මාලා ළඟ මුදලක් තිබේ. තව රුපියල් 10ක් දුන් විට ඇය ළඟ තිබෙන මුදල රුපියල් 25ක් වේ. මාලා ළඟ තිබූ මුදල කොපමණ ද?

# පරිමාව හා ධාරිතාව

## 8.4 ජලය ආසන්න ලීටරයට හෝ මිලිලීටර 100 ට මනිමු

ජලය ලීටර 1 - 3ක් අතර ප්‍රමාණයක් අල්ලන බඳුන් 2ක්, ලීටරයකට අඩු ධාරිතාව සහිත හිස් බෝතල් 2ක්, පාට කළ ජලය සහිත බඳුනක් , පුනීලයක් සහ සාදා ගත් මිනුම් සරාවක් සපයා ගන්න.

**ක්‍රියාකාරකම 1**

ධාරිතාව ලීටරයකට අඩු බඳුන්වලට අසමාන ජල ප්‍රමාණ 2ක් අහඹු ලෙස දමා ඉදිරිපත් කරන්න. ඒ ඒ ජල පරිමාව අසන්න. 100*ml* වලින් ප්‍රකාශ කරවන්න.

ජල පරිමාව - බඳුන 1 ☐ *ml*

- බඳුන 2 ☐ *ml*

**ක්‍රියාකාරකම 2**

ධාරිතාව ලීටර 1 - 3ක් අතර බඳුන් දෙකට අසමාන ජල ප්‍රමාණ 2ක් අහඹු ලෙස දමා ආසන්න ලීටරයට මනින ලෙස කියන්න.

ජල පරිමාව - බඳුන 1 ☐ *l*

- බඳුන 2 ☐ *l*

පැවරුම

(1) මෙගා පැණි බීම බෝතලයක ධාරිතාව මිලිලීටර කොපමණ වේ ද?

(2) කුඩා පලතුරු බීම බෝතලයක හා ජෑම් බෝතලයක ධාරිතාව මිලිලීටර කොපමණ ද?

# මුදල්

## 10.6 රුපියල් 20කින් ආපසු ලැබෙන ඉතුරු මුදල සොයමු

නිදසුන බලා වගුව සම්පූර්ණ කරන්න.

| | ගත් බඩුවල මිල | මිලවල එකතුව (රුපියල්) | බඩුවල මුලු අගය (රුපියල්) | 20ක් වීමට එකතු කළ යුතු මුදල | ඉතුරු මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|
| (1) | මකනය රුපි. 5; පැන්සලය රුපි. 10 | 5 + 10 | 15 | 20 + 5 | 5 |
| (2) | ස්ටිකරය රුපි. 2; ස්ටිකරය රුපි. 2; පැන්සල් උල්කරණය රුපි. 5 | 2 +2+ 5 | …… | ……. | ……. |
| (3) | රඹුටන් රුපි. 3; පේර රුපි. 2; රඹුටන් රුපි. 3; මැන්ගුස්ටින් රුපි. 4 | 3 + 3 + 2 + 4 | …… | ……. | ……. |
| (4) | ජම්බනාරං රුපි. 4; ජම්බනාරං රුපි. 4; ජම්බනාරං රුපි. 4 | 4 + 4 + 4 | …… | ……. | ……. |
| (5) | දොඩම් රුපි. 10; අලිපේර රුපි. 8 | 10 + 8 | …… | ……. | ……. |
| (6) | ඇපල් රුපි. 10; දොඩම් රුපි. 10 | ……… | …… | ……. | ……. |
| (7) | කතුර රුපි. 5; ගම්බෝතලය රුපි. 7 | …….. | …… | ……. | ……. |
| (8) | හුණුකූර රුපි. 2; හුණුකූර රුපි. 2; මකනය රුපි. 5 | ……. | …… | ……. | ……. |

# සංඛ්‍යා

## 1.8 ඉලක්කම් 3 සංඛ්‍යාවක ඉලක්කම්වල ස්ථානීය අගය සහ නිරූපිත අගය දක්වමු.

වගුවෙහි හිස් කොටු පුරවන්න.

(1)

| සංඛ්‍යාව (සංඛ්‍යාංකය) | ස්ථානීය අගය | | | ස්ථානය අනුව නිරූපිත අගය | | | සංඛ්‍යා නාමය |
|---|---|---|---|---|---|---|---|
| | සි | ද | එ | සි | ද | එ | |
| 694 | 6 | 9 | 4 | 600 | 90 | 4 | හයසිය අනූ හතර |
| ------ | -- | -- | -- | 400 | 10 | 5 | ------------- |
| ------- | --- | -- | -- | ---- | ---- | --- | පන්සිය පහ |
| 900 | --- | -- | -- | --- | ---- | --- | --------------- |
| ----- | 7 | 7 | 7 | ---- | --- | --- | --------------- |

(2) වගුව සම්පූර්ණ කරන්න.

| ඉලක්කම්වල නිරූපිත අගය | සංඛ්‍යාංකය | සංඛ්‍යා නාමය |
|---|---|---|
| 700 + 90 + 8 | 798 | හත්සිය අනූ අට |
| 800 + 80 + 8 | ......... | ......................... |
| 600 + 0 + 5 | ......... | ......................... |
| 900 + 70 + 0 | ......... | ......................... |
| 500 + 0 + 0 | ......... | ......................... |

(3) එක් එක් ගණක රාමුවේ දක්වෙන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.



# සංඛ්‍යා - එකතු කිරීම

## 2.7 ගෙන යාම රහිත ඉලක්කම් 2 සංඛ්‍යා 2ක් එකතු කරමු.

නිදසුන : 3 වන ශ්‍රේණියේ එක පන්තියක ළමයි 34 ක් ද තවත් පන්තියක ළමයි 35ක් ද ඉගෙනුම ලබති. පන්ති 2 කේම සිටින ළමයි සංඛ්‍යාව කීය ද?

| | | | |
|---|---|---|---|
| විසඳුම : | එක පන්තියක ළමයි | = | 34 |
| | අනෙක් පන්තියේ ළමයි | = | 35 |
| | පන්ති දෙකේ ම ළමයි | = | 34 + 35 |
| | | = | 69// |

4.2 පාඩමේ දී ඉගෙන ගත් එකතුව 9 තෙක් වන සංඛ්‍යා බන්ධන නැවත මතක් කර ගන්න.

**අභ්‍යාසය 1**

එකතු කරන්න.

(1)
```
   ද   එ
   7   3
+  1   5
 [      ]
```

(2)
```
   ද   එ
   2   4
+  5   5
 [      ]
```

(3)
```
   ද   එ
   4   3
+  5   2
 [      ]
```

(4)
```
   ද   එ
   2   2
+  6   7
 [      ]
```

(5)
```
   ද   එ
   5   0
+  4   4
 [      ]
```

(6)
```
   ද   එ
   3   0
+  6   0
 [      ]
```

**අභ්‍යාසය 2**

වගන්ති නොලියා ලබා ගත් ආකාරය පෙන්වමින් විසඳුම් ලියා දක්වන්න.

(1) පාන් ගෙඩියක් රුපියල් 36ක් වේ. බනිස් එකක් රුපියල් 12 ක් වේ. දෙකට ම ගෙවිය යුතු මුළු මුදල කොපමණ ද?

(2) සාමා දුම්රියෙන් කිලෝමීටර 40ක් ගොස් බසයෙන් තව කිලෝමීටර 12ක් ගියාය. ඇය ගිය මුළු දුර කිලෝමීටර කීය ද?

(3) බැරලයක පොල්තෙල් ලීටර 62ක් ඇත. තව තෙල් ලීටර 25ක් ඊට එකතු කළ විට එහි තිබෙන මුළු තෙල් ලීටර ගණන සොයන්න.

(4) ගෝනියක හාල් කිලෝග්‍රෑම් 50ක් ද තවත් ගෝනියක හාල් කිලෝග්‍රෑම් 65ක් ද ඇත. ගෝනි දෙකේ ම හාල් කිලෝග්‍රෑම් කොපමණ තිබේ ද?

# බෙදීම

## 5.4 පස් දෙනකු අතරේ ද්‍රව්‍ය සංඛ්‍යාවක් සම සම ව බෙදා ගනිමු.

ද්‍රව්‍ය 15ක් 5 දෙනකු අතරේ බෙදා ගැනීමට ඉදිරිපත් කරන්න. 5 දෙනාම වෙන් වෙන් ව පිහිටි ස්ථාන 5 තෝරා ගන්න. වරකට ස්ථාන 5හිම ද්‍රව්‍ය 1ක් බැගින් තබමින් බෙදා දීමට ඇති මුළු ද්‍රව්‍ය ප්‍රමාණය අවසන් වන තෙක් වරකට 1 බැගින් ස්ථාන 5 හිම තබන්න.

බෙදා හැරීම අවසන් වූ පසු ස්ථාන 5හිම සමාන ද්‍රව්‍ය සංඛ්‍යාවක් බැගින් තිබෙනු ඇත.

මේ අනුව 15ක් සම සම ව 5 දෙනකු අතරේ බෙදූ විට එක් අයකුට 3ක් හිමිවේ.

,

එනම්

$$5\overline{)15}\quad 3,\quad 15,\quad 0$$

= 3 වේ.

දෙන ලද සංඛ්‍යාවක් 5න් බෙදීමේ දී 5 ගුණන වගුව මතක තබා ගත යුතු වේ.

නිදසුන 45 , 5න් බෙදන්න.

$$5\overline{)45}\quad 9,\quad 45,\quad 0$$

45 ÷ 5 = 9// වේ.

**අභ්‍යාසය**

බෙදන්න.

(1) $5\overline{)30}$  (2) $5\overline{)15}$  (3) $5\overline{)40}$  (4) $5\overline{)50}$

(5) $5\overline{)25}$  (6) $5\overline{)35}$  (7) $5\overline{)45}$  (8) $5\overline{)20}$

# මිනුම් - දිග හා දුර

## 7.5 නිමානය කළ දිග හරි දැයි බලමු

පහත වගුවේ දැක්වෙන ඒවායේ ඒ ඒ දිග පළල උස මීටර මෙපමණ වේ යැයි පළමුවෙන් සිතන්න. එය සටහන් කරන්න.

මීටරයක් දිග කෝටුවක් ගන්න. කෝටුවෙන් එම දිග පළල උස ආසන්න මීටරයට මනින්න. එය ද සටහන් කරන්න.

සිතූ දිග සැබෑ දිග සමග සසඳා වගුව සම්පූර්ණ කරන්න.

වගුව

| මනිනු ලබන දෙය | සිතූ දිග | සැබෑ දිග | වෙනස වැඩි ගණන | වෙනස අඩු ගණන |
|---|---|---|---|---|
| කාමරයේ දිග | 7 | 6 | 1 | - |
| කාමරයේ පළල | | | | |
| ස්තෝප්පුවේ දිග | | | | |
| ඇඳක දිග | | | | |
| මේසයක දිග | | | | |

# මිනුම් - කාලය

## 9.5 සතියේ දවස්වල නම් අනුපිළිවෙළින් දැන ගනිමු.

සතියේ දවස්වල නම් වෙන වෙන ම ලියූ තරමක් ගන පත්‍රිකා 7න් පිළියෙළ කර ගන්න.

දරුවන්ගෙන් ඔවුන් දන්නා සතියේ දවස්වල නම් කීමට සලස්වමින් සතියේ දවස් පිළිබඳ සාකච්ඡා කිරීම පටන් ගන්න.

මෙබඳු සරල ප්‍රශ්න ඔවුනට ඉදිරිපත් කරන්න.

අද කවදා ද? ඊයේ කවදා ද? හෙට කවදා ද?

පාසලට නොපැමිණෙන දවස් මොනවා ද?

දවසක නම සඳහන් වන සෑම අවස්ථාවක ම එම දවස ලියන ලද පත්‍රිකාව ඉදිරිපත් කරන්න.

මේ නයින් සතියේ දවස් 7ම නම් ඉදිරිපත් වීමෙන් පසුව ඒවා අනුපිළිවෙළට නැවත කියන ලෙස කැමැත්තෙන් ඉදිරිපත් වන දරුවකුට කියන්න.

| | | | |
|---|---|---|---|
| සඳුදා | බ්‍රහස්පතින්දා | අඟහරුවාදා | සිකුරාදා |
| බදාදා | ඉරිදා | සෙනසුරාදා | |

කැලැන්ඩරයක සතියේ දවස් කෙටියෙන් දක්වා තිබෙන අයුරු පැහැදිලි කරන්න.

| | | | |
|---|---|---|---|
| Monday | Tuesday | Wednesay | Thursday |
| Friday | Saturday | Sunday | |

යන දවස්වල ඉංග්‍රිසි නම් දරුවන් කැමැත්තක් දක්වන්නේ නම් ඉදිරිපත් කරන්න.

පැවරුම

සිංහල - ඉංග්‍රීසි වශයෙන් සතියේ දවස් හතෙහි නම් පිටපත් කර ගැනීමට අවස්ථාව දෙන්න.

# දිශාව

## 13.2 සරල විධාන මාලාවක් පැහැදිලි ව දීමට හා විධානයකට නිවැරදි ප්‍රතිචාර දැක්වීමට හුරු ව ලබමු.

ක්‍රියාකාරකම : දරුවන් එළිමහන් තැනකට ගෙන යන්න. කිසියම් වස්තුවක් තබන්න.
දරුවකු තමා ළඟ කිසියම් පැත්තකට මුහුණ සිටී නම් අදාළ වස්තුවට ඔහු ළඟා කරවීම සඳහා පහත සඳහන් ආකාරයේ විධාන මාලාවක් දෙන්න.

ආපසු හැරෙන්න
ඉදිරියට පියවර 10ක් යන්න.
දකුණට හැරෙන්න.
ඉදිරියට පියවර 10ක් යන්න.
වමතට හැරෙන්න.
ඉදිරියට පියවර 8 ක් යන්න.
දකුණට හැරෙන්න.
ඉදිරියට පියවර 2 ක් යන්න.
නැවත වමතට හැරෙන්න.
ඉදිරියට පියවර 4 ක් යන්න.
නවතින්න.
බිම බලන්න.




අභ්‍යාසය

ඒ ඒ දරුවා වස්තුවට සාපේක්ෂ ව සිටින ස්ථානය වෙනස් කර යා යුතු ගමන් මගට අනුරූප ව හා දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් දෙනු ලබන විධාන මාලාව වෙනස් කර ඉදිරිපත් කරන්න.

## 3.7 ගෙන ඒම සහිත ව ඉලක්කම් 2 සංඛ්‍යාවකින් තවත් සංඛ්‍යාවක් අඩු කරමු.

නිදසුන : 45න් 27 ක් අඩු කරන්න.
එකේ ඒවා තීරයේ 5න් 7ක් අඩු කළ නොහැකි ය.
ද්‍රව්‍ය ඇසුරෙන් මෙම අඩු කිරීම ඉදිරිපත් කර ඇති හැටි බලන්න.

| | ද | එ |
|---|---|---|
| - | 4 | 5 |
| - | 2 | 7 |

**ගණක පෙත**




$$\begin{array}{rcl} & & 10 \\ 45 & \rightarrow & 40 + 5 \\ -\,27 & \rightarrow & 20 + 7 \\ \hline 18 & \rightarrow & 10 + 8 \end{array}$$

| | ද | එ |
|---|---|---|
| | 3 | 10 |
| - | ~~4~~ | 5 |
| - | 2 | 7 |
| | 1 | 8 |

ඉහත 10 ඒවා තීරයේ 1ක් එනම් 10ක් 5 ට එකතු වූ විට 15 යි
15 - 7 → 8 යි.
මෙහි 10 ඒවා තීරයෙන් 1 ඒවා තීරයට **ගෙන ඒමක්** සිදු වේ.

**අභ්‍යාසය** 1 - අඩු කරන්න

(1)

| | ද | එ |
|---|---|---|
| - | 5 | 3 |
| - | 2 | 4 |
| | | |

(2)

| | ද | එ |
|---|---|---|
| - | 6 | 1 |
| - | 1 | 7 |
| | | |

(3)

| | ද | එ |
|---|---|---|
| - | 7 | 0 |
| - | 2 | 3 |
| | | |

(4)

| | ද | එ |
|---|---|---|
| - | 6 | 8 |
| - | 3 | 9 |
| | | |

(5)

| | ද | එ |
|---|---|---|
| - | 5 | 0 |
| - | 4 | 7 |
| | | |

# ගුණ කිරීම

## 4.5 10 න් ගුණ කරමු

අභ්‍යාසය 1

හිස් කොටු තුළ ගැළපෙන සංඛ්‍යා ලියන්න.

(1) 5 X 10 = ☐ (2) ☐ X 10 = 60

(3) ☐ X 10 = 70 (4) 8 X 10 = ☐

(5) ☐ X 10 = 90 (6) ☐ X 10 = 30

(7) 4X 10 = ☐ (8) 10 X 10 = ☐

අභ්‍යාසය 2

10 ගුණන වගුව ඇසුරෙන් පහත සඳහන් ගැටලු විසඳන්න.

(1) අඹ ගෙඩියක් රුපියල් 8 ක් වේ නම් අඹ ගෙඩි 10 ක මිල කොපමණ වේ ද?

(2) පැකට්ටුවක තේ කොළ 5g අඩංගු වේ නම් එවැනි තේ පැකට් 10 ක තේ කොළ කොපමණ අඩංගු වේ ද?

(3) මෝටර් රථයකට පෙට්‍රල් ලීටරයකින් 8km දුර හා හැකි ය. පෙට්‍රල් ලීටර 10න් එයට කොපමණ දුර යා හැකි ද?

(4) ලොරියකට ටයර් 6ක් අවශ්‍ය කෙරේ. ලොරි 10ට අවශ්‍ය ටයර් සංඛ්‍යාව කොපමණ ද?

(5) කෙසෙල් ගෙඩි 10ක් එක කෙසෙල් ඇවරියක ඇත. එවැනි කෙසෙල් ඇවරි 9 ක ඇති කෙසෙල් ගෙඩි ගණන කොපමණ ද?

# මුදල්

## 10.7 රුපියල් 50 සහ රුපියල් 100 නෝට්ටු හඳුනා ගනිමු

| රුපියල් 50<br>නෝට්ටුවක රූපය | රුපියල් 100<br>නෝට්ටුවක රූපය |
|---|---|
| රූපය 1 | රූපය 2 |

රූපය 1 නෝට්ටුවේ අගය රුපියල් කීය ද? ☐

රූපය 2 නෝට්ටුවේ අගය රුපියල් කීය ද? ☐

> රුපියල් 50 සහ රුපියල් 100 සැබෑ නෝට්ටු
> යුගළ 2ක් පමණ සොයා ගන්න.

නෝට්ටු 2 හි ලක්ෂණ සීරුවෙන් පරික්ෂා කර බලන්න. ඒ ඒ ලක්ෂණය පහත වගුවෙහි අදාළ හිස් කොටුව තුළ ලියන්න.

**වගුව නෝට්ටු ලක්ෂණ**

| ලක්ෂණය | රුපියල් 50 නෝට්ටුව | රුපියල් 100 නෝට්ටුව |
|---|---|---|
| පාට | නිල් පාට | තැඹිලි පාට |
| ඉදිරිපස රූපය | | |
| සඳහන් වන භාෂා වර්ග | | |
| නිකුත් කළ බැංකුව | | |
| නිකුත් කළ දිනය | | |
| අගය සඳහන් තැන් ගණන ඉලක්කමෙන් | | |
| අගය සඳහන් තැන් ගණන අකුරෙන් | | |

# ප්‍රස්තාර

## 12.3 ප්‍රගණන වගුවක් සංඛ්‍යාමය තොරතුරු රැස් කරමු.

අවශ්‍ය දේ : * එක පාටකින් 8 - 12 බැගින් සුදු පාට මල්, කහ පාට මල් හා රතුපාට මල් 25 - 30 අතර මල් සංඛ්‍යාවක් සොයා ගන්න.

* එක් වර්ගයකින් ඇට 10 - 15 බැගින් මදටිය ඇට, සියඹලා ඇට, දොඹ ඇට, අනෝදා ඇට වැනි ප්‍රදේශයෙන් සපයා ගත හැකි ඇට වර්ග 3ක් ඇට 30 - 35 අතර සංඛ්‍යාවක් සොයා ගන්න.

**ක්‍රියාකාරකම :** පාට තුනෙහි මල් සමූහය ඉදිරිපත් කරන්න. එහි එක් එක් වර්ගයෙන් මල් කීය බැගින් තිබේ දැයි දැන ගැනීමට ගණන් කළ හැකි දැයි අසන්න. සාමාන්‍යයෙන් එලෙස ගණන් කිරීමට මල් වර්ග පළමුවෙන් වෙන් කර ගත යුතු ව ඇත. එවැනි දෙයක් නොකර ගණන් කළ හැකි දැයි අසන්න.

| මල | වාර ගණන | සංඛ්‍යාව |
|---|---|---|
| කහපාට | 卌 卌 | 10 |
| සුදු පාට | 卌 卌 \|\|\| | 13 |
| රතු පාට | 卌 卌 \|\| 卌 | 17 |
| එකතුව | | 40 |

වගුව

මල් වර්ගය ගැන නොසලකා මල් එකින් එක පිළිවෙළින් ගණන් කර පසෙක තබමින් මෙහි දැක්වෙන වගුවේ සටහන් කළ හැකි බව කියන්න.

**සටහන් කරන ආකාරය :**

එක මලකට එක ඉරි කැබැල්ලක් බැගින් මල් 4ක් සිරස් ඉරි කැබලි 4කින් සටහන් කර මෙම ඉරි කැබලි කැපී යන ලෙස හරහට ඉරි කැබැල්ලක් ඇඳ මල් 5ක් පෙන්වනු ලැබේ. 卌 $\rightarrow$ 5

එක පේළියක ඉරි කැබලිවල එකතුව එනම් වාර ගණන් වල එකතුව සංඛ්‍යාව තීරයේ දක්වනු ලැබේ. මේ ආකාරයට වර්ග 3හි ම මල්වල එකතුව ද සොයා ගත හැකි ය.

පැවරුම : එක වර්ගයකින් ඇට 10 - 12 පමණ බැගින් වර්ග 3ක ඇට 30 - 40 අතර ගණනක් අහඹු ලෙස ගන්න. ඉහත සඳහන් වගුවට සමාන වගුවක් ඇඳ ගෙන ඇට වර්ග වල නම් ලියා ගන්න.

ඒ ඒ වර්ගයේ ඇට කීය බැගින් තිබේ දැයි එකකට එක ඉරි කැබැල්ල බැගින් ඇඳ සොයන්න.
මුළු ඇට ගණන කීය ද?

# සංඛ්‍යා - එකතු කිරීම

## 2.8 ගෙන යාම සහිත ව සංඛ්‍යා 2ක් එකතු කරමු.

නිදසුන : කිරිහලක කිරි පැකට් උදය වරුවේ 56 ක් ද සවස වරුවේ 37 ක් ද විකුණනු ලැබීය. වරු දෙකේ ම විකුණන ලද කිරි පැකට් ගණන කීය ද?

විසඳුම : උදය වරුවේ කිරි පැකට් = 56

සවස් වරුවේ කිරි පැකට් = 37

විකුණූ මුළු කිරි පැකට් ගණන = 56 + 37

= 93//

$56 \rightarrow 50 + 6$

$+37 \rightarrow 30 + 7$

$93 \rightarrow 80 + 13$

සංඛ්‍යා දෙක පහළට මෙසේ එකතු කරන්න




(1) ද එ
2 7
+ 3 6

(2) ද එ
5 5
+ 2 9

(3) ද එ
6 9
+ 2 1

(4) ද එ
7 3
+ 1 9

(5) ද එ
5 6
+ 4 4

අභ්‍යාසය 2

වගන්ති නොලියා ලබා ගත් ආකාරය පෙන්වමින් විසඳුම් සොයන්න.

(1) කොළඹ සිට පානදුරට කිලෝමීටර 27 ක් ද පානදුර සිට කළුතරට කිලෝමීටර 16ක් ද ඇත. කොළඹ සිට පානදුර හරහා කළුතරට කිලෝමීටර කොපමණ දුර ද?

(2) සමන් ළඟ රුපියල් 25ක් තිබුණි. අම්මා තව රුපියල් 55ක් දුන්නාය. දැන් ඔහු ළඟ රුපියල් කීයක් තිබේ ද?

(3) එක දුම්රිය මැදිරියක මගීන් 47 දෙනෙක් ද තවත් මැදිරියක මගීන් 39 ක් දෙනෙක් ද ගමන් කරති. මැදිරි දෙකේ ම ගමන් කර මගීන් සංඛ්‍යාව කීය ද?

(4) සුදු හාල් කිලෝග්‍රෑමයක් රුපියල් 56ක් වේ. පොල් ගෙඩියක් රුපියල් 34ක් වේ. මේ දෙකට ම ගෙවිය යුතු මුළු මුදල සොයන්න.

# බෙදීම

## 5.5 සංඛ්‍යාවක් 5න් බෙදීමට අදාළ ගැටලු විසඳමු.

**නිදසුන :** සහල් ඇසුරුම් මලු 5ක් 55kg බර නම් එක මල්ලක බර කොපමණ වේ ද?

**විසඳුම :** එක මල්ලක බර සෙවීමට මුළු බර 5න් බෙදමු.

එනම් 55 5

```
   11
5 |55
  |5
  |--
    5
    5
   --
    0
```

එක මල්ලක බර = 11kg වේ.

අභ්‍යාසය

විසඳන්න.

÷

(1) අභ්‍යාස පොත් 40 ක් ළමයි 5 දෙනෙක් අතරේ සමාන ව බෙදා දෙන ලදි. එක ළමයකුට ලැබුණ පොත් ගණන කීය ද?

(2) අඹ ගෙඩි 50ක් සමාන ගොඩවල් 5 ට වෙන් කරන ලදි. එක ගොඩක ඇති අඹ ගෙඩි ගණන කොපමණ ද?

(3) මකන කෑලි 5ක මිල රුපියල් 35ක් වේ. එක මකන කෑල්ලක මිල කොපමණ ද?

(4) ළමයි 35 දෙනෙක් සමාන කණ්ඩායම් 5ට බෙදුවේ නම් එක කණ්ඩායමක සිටින ළමයි සංඛ්‍යාව කොපමණ ද?

(5) රුපියල් 100ක් ළමයි 5 දෙනෙක් සමාන ව බෙදන ලදී. එක ළමයකුට ලැබෙන මුදල කීය ද?

# මිනුම් - කාලය

## 9.6 මාසවල නම් අනුපිළිවෙළින් දැන ගනිමු

මාස 12 දැක්වෙන කැලැන්ඩරයක් හා මාසවල නම් වෙන වෙන ම ලියන ලද පත්‍රිකා 12 ක් **නැතිනම්** සකස් කර ගන්න.

තම තමන් උපන් මාසවල නම් දන්නෙහි දැයි පළමුවෙන් දරුවන්ගෙන් අසන්න.

කාගෙත් උපන් මාස පිළිවෙළින් අසා ඒ ඒ මාසය දැක්වෙන පත්‍රිකාව ඉදිරිපත් කරන්න.

ඉදිරිපත් නොවී ඇති මාස වේ නම් ඒවා පිළිබඳ විමසන්න. මාසවල නම් දැක්වෙන පත්‍රිකා මේ වන විට අපිළිවෙළින් ඉදිරිපත් වී තිබෙනු ඇත.

දරුවන්ගේ ද උදවු ඇති ව ඒවා පිළිවෙළින් සකස් කරවන්න.

මාසවල ඉංග්‍රිසි නම් ද ඔවුන් කැමැත්තක් දක්වන්නේ නම් ඉදිරිපත් කරන්න.

# ඝනවස්තු හා හැඩතල

## 11.5 ජ්‍යාමිතික හැඩවල ලක්ෂණ හඳුනා ගනිමු.

පහත පෙනෙන අයුරු තරමක් ගන කඩදාසි කැබලි 4ක ඒ ඒ ජ්‍යාමිතික හැඩය ඇඳ එය කපා ඉවත් කර හිඩැස් පත් 4ක් සාදා ගන්න.



**ඍජුකෝණාස්‍රය** **සමචතුරස්‍රය** **ත්‍රිකෝණය** **වෘත්තය**

හිඩැස් පත් භාවිත කර එක් එක් හැඩය කඩදාසියක නැවත ඇඳ එම හැඩතල කපා ගන්න.



හැඩතල

ඍජුකෝණාස්‍රය - හැඩතලය සමාන කොටස් 2ක් ලැබෙන සේ නවන්න. එමගින් විරුද්ධ පැති සමාන බව පෙන්වන්න. දිග පැති 2න් ද දිග අඩු පැති 2න් ද වටවුණු රූපයකි. මුලු 4 ම එක වගේ ය.

සමචතුරස්‍රය - පැති සියල්ලම සමාන ය. මුලු 4 ම එක වගේ ය. සමාන කොටස් 2 ක් ලැබෙන සේ කීප විදියකට නැමිය හැකි ය.

ත්‍රිකෝණය - පැති 3ක් වටවුණු රූපයකි.

වෘත්තය - රවුම් හැඩයේ රූපයකි. සමාන කොටස් 2ක් ලැබෙන සේ කිහිප විධියකට නැමිය හැකි ය.

ඉහත එක් එක් හැඩයට නිදර්ශනය බැගින් පරිසරයෙන් ඉදිරිපත් කරන්න.

**අභ්‍යාසය 1**

එක් එක් හිඩැස් පත විවිධ ඉරියව්වල තබා හැඩ ඇඳීමට සලස්වන්න. නිදසුන බලන්න.



**අභ්‍යාසය 2**

හැඩ කිහිපයක හිඩැස් පත් භාවිත කර විවිධ රූප ඇඳීමට සලස්වන්න.

පහත නිදසුන බලන්න.



රූපය 1



රූපය 2



රූපය 3

# සංඛ්‍යා

## 1.9 සංඛ්‍යාංකයක් අනුරූප සංඛ්‍යාංක කිහිපයකින් තෝරා ගනිමු

**අභ්‍යාසය 1**

සංඛ්‍යා පත් කිහිපයක් පහත දැක්වෙයි. ඒවා අතරින්

379 | 973 | 793 හා 397 යන සංඛ්‍යාංක හතර තෝරන්න ඒවා පාට කරන්න.




**අභ්‍යාසය 2**

සංඛ්‍යාංකය හා සංඛ්‍යා නාමය එකට එක ගළපමු. වමත් පස තීරයේ ඇති එක් එක සංඛ්‍යාව දකුණත් පස තීරයේ සංඛ්‍යා නාමය හා ඉරකින් යා කර පෙන්වන්න.

| | |
|---|---|
| 468 | හයසිය හතළිස් අට |
| 864 | අටසිය හතලිස් හය |
| 648 | හාරසිය හැට අට |
| 486 | හයසිය අසූ හතර |
| 846 | අටසිය හැට හතර |
| 684 | හාරසිය අසූ හය |
| | අටසිය තිස් හය |

# සංඛ්‍යා අඩු කිරීම

## 3.8 සංඛ්‍යා එකතු කිරීම සහ අඩු කිරීම හා සම්බන්ධ ගැටලු විසඳමු.

**නිදසුන :**
දුම්රිය මැදිරියක මගීන් 47 දෙනකු සිටියා. දුම්රිය පළක දී මගීන් 21 දෙනකු බැස ගියා. 24 දෙනකු නැවත නැග්ගා. මැදිරියෙහි දැන් සිටින මගීන් ගණන සොයන්න.

පියවරෙන් පියවර මෙලෙස විසඳමු.

| | | |
|---|---|---|
| | ද | එ |
| - | 4 | 7 |
| - | 2 | 1 |
| | 2 | 6 |

සිටි මගීන් ගණන = 47
බැස ගිය ගණන = 21
ඉතුරු මගීන් ගණන = 47 - 21
= 26

| | | |
|---|---|---|
| | ද | එ |
| - | 2 | 6 |
| + | 2 | 4 |
| | 5 | 0 |

නැවත නැග්ග ගණන = 24
දැන් සිටින මගීන් ගණන = 26 + 24
= 50//

සංඛ්‍යා දෙකක් හරහට එකතු කිරීමට හෝ අඩු කිරීමට හෝ අපහසු විට ඒවා පහළට ලියා අගය සොයන්න.

**අභ්‍යාසය 1**

(1) පාසල් අවන්හලක් දින 3ක් තුළ විකුණන ලද කිරි පැකට් හා යෝගට් ප්‍රමාණ මෙසේ ය.

| දිනය | සඳුදා | අඟහරුවාදා | බදාදා | එකතුව |
|---|---|---|---|---|
| කිරි පැකට් | 43 | 40 | 36 | ------- |
| යෝගට් | 25 | 27 | 28 | ------- |
| එකතුව | ---- | ----- | ----- | ------- |

(i) ඉහත වගුවෙහි හිස් තැන් පුරවන්න.

(ii) සඳුදා සහ බදාදා විකුණන ලද කිරි පැකට් සහ යෝගට් සංඛ්‍යාවල වෙනස කීය ද?

(iii) දින 3 තුළ වැඩියෙන් ම විකිණී ඇත්තේ මොනවා ද?

(iv) දින 3 තුළ විකුණන ලද කිරි පැකට් ගණනෙහි සහ යෝගට් ගණනෙහි වෙනස සොයන්න.

# ගුණ කිරීම

## 4.6 2න් හා 5න් හා ගුණ කිරීමට අදාළ ගැටලු විසඳමු.

අභ්‍යාස 1

ගුණ කරන්න.

| | | | |
|---|---|---|---|
| (1) 22<br>2 | (2) 31<br>5 | (3) 24<br>2 | (4) 41<br>5 |
| (5) 33<br>2 | (6) 34<br>2 | (7) 43<br>2 | (8) 21<br>5 |

අභ්‍යාස 2

**පහත සඳහන් ගැටලු විසඳන්න-** ×

(1) පෙට්ටියක පාට පැන්සල් 6ක් තිබේ. එවැනි පෙට්ටි 5ක පාට පැන්සල් කීයක් තිබේ ද?

(2) වටලප්පන් එකක් රුපියල් 20ක් වේ. වටලප්පන් 2ක මිල කොපමණ ද?

(3) දුසිමකට කෝප්ප 12ක් තිබේ. දුසිම් 2ක කෝප්ප කීයක් තිබේ ද?

(4) එක් අයකුගේ බස් ගාස්තුව රුපියල් 9කි. දහ දෙනකුගේ බස් ගාස්තුව කොපමණ ද?

(5) පැකට් එකක සීනිබෝල 24ක් ඇත. එවැනි පැකට් 2ක ඇති සිනිබෝල සංඛ්‍යාව කොපමණ ද?

(6) ශාලාවක එක පේළියක පුටු 20ක් බැගින් පේළි 10ක් ඇත. එහි ඇති මුළු පුටු ගණන සොයන්න.

(7) යුනිෆෝම් ඇඳුමක් මැසීමට මීටර 2ක් අවශ්‍ය ය. එවැනි යුනිෆෝම් ඇඳුම් 5ක් මැසීමට මීටර කොපමණ අවශ්‍ය වේ ද?

(8) සහල් 10kg පැකට් 5ක මුළු බර කොපමණ ද?

# මුදල්

## 10.8 රුපියල් සතවලින් ගනුදෙනු කරමු.

රුපියල් සත ලියන ආකාරය පැහැදිලි කරන්න. 15.00 හි තිතට දකුණින් පස 00 යොදනුයේ සත නැති බව පෙන්වීමට ය.

**මිල දර්ශනය**

| බඩුව | මිල රුපියල් |
|---|---|
| පැන්සල | 8.50 |
| පෑන | 15.00 |
| මකනය | 5.25 |
| කොපි පොත | 22.50 |
| ස්ටිකරය | 0.75 |

බඩු මිල දර්ශනය අනුව පහත වගුවෙහි සඳහන් එක් එක් බඩුව මිල දී ගනු ලබන විට දෙන මුදලට ලැබෙන ඉතුරු මුදල සොයන්න.

නිදසුන බලන්න.

රුපියල් 10න් රුපියල් 5 .25 අඩු කළ විට ඉතුරු වන මුදල රුපියල් 10ක් වීමට රුපියල් 5 .25ට එකතු කළ යුතු මුදල සෙවීමෙන් ලබා ගෙන ඇත.

| බඩුව | මිල රුපියල් | දුන් මුදල | ඉතුරු මුදල (රුපියල්) |
|---|---|---|---|
| මකනය | 5.25 | 10.00 | 4.75 |
| පැන්සලය | 8.50 | 20.00 | |
| පෑන | 15.00 | 20.00 | |
| කොපි පොත | 22..50 | 30.00 | |
| ස්ටිකරය | 0.75 | 2.00 | |

# ප්‍රස්තාර

## 12.4 සංඛ්‍යාමය තොරතුරු ප්‍රස්තාරයකින් දක්වමු

3 වන ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් මිනිත්තු 10ක් තුළ තම පාසල ඉදිරියෙහි වූ මහ පාරේ දෙපැත්තට ගිය වාහන පිළිබඳ රැස් කර ගත් තොරතුරු පහත වගුවේ දැක්වේ. එම තොරතුරු ප්‍රස්තාරයක රූපික ව නිරූපණය කරන්න.

| වාහන වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| යතුරු පැදි | 8 |
| බස් | 3 |
| ත්‍රිරෝද රථ | 6 |
| වෑන් රථ | 4 |

පළමුවෙන් තීර 4ක කොටු සැලැස්මක් ඇඳ ගන්න. එහි ඒ ඒ තීරය හඳුන්වන වාහන වර්ගයේ නම ලියන්න.

පාට කළ කුඩා වෘත්තයකින් හෝ තරුවකින් හෝ එක වාහනයක් නිරූපණය වන සේ ඒ ඒ තීරයට අදාළ වාහන සංඛ්‍යාව පහළ සිට ඉහළට විහිදෙන සේ කුඩා වෘත්තවලින් දක්වන්න.




* ප්‍රස්තාරය ඇසුරෙන් මෙබඳු ප්‍රශ්නවල උත්තරදීමට සලස්වන්න.

* අඩුවෙන් ම ගිය වාහන වර්ගය කුමක් ද? වාහන සංඛ්‍යාව කීය ද?

* ත්‍රිරෝද රථ ගණනට වඩා යතුරු පැදි කීයක් ගියේ ද?

* වෑන් රථ ගණන මෙන් දෙගුණයක් ගිය වාහන වර්ගය කුමක් ද?

* ගිය මුළු වාහන සංඛ්‍යාව කීය ද?